පටුන

පටුන 1

පූර්විකාව 2

විධායක වාර්තාව 3

හැඳින්වීම 4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය 5

දැක්ම 5

මෙහෙවර 5

සංවිධාන සැලැස්ම 6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2012 7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2012 8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව - 2012 9

2012 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය 11

වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම 11

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන් 12

වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5,000 ආධාර ලබාදීම 15

රු. 7,500 මූල්‍යමය ආධාර ලබාදෙන ලද පාදේශීය වැඩිහිටි බල මණ්ඩල 16

රු. 15,000 මූල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩල 16

දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම 17

විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම 17

ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන 18

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන 19

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු 23

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 24

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය 25

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති 27

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව 28

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් වාර්තාව 29

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ 30

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය 30

උප ලේඛන 31

විගණකාධිපතිගේ මතය 34

විගණකාධිපති වාර්තාව 35

විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු 36

පූර්විකාව

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමාජ සේවා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ උන්නතිය උදෙසා ගනු ලන ක්‍රියාමාර්ග ප්‍රතිපත්තිමය තීරණ උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව සකස් කරයි.

2012 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සාක්ෂාත් කරගැනීමෙහිලා ක්‍රියාත්මක වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2012 වර්ෂයේ මෙම වාර්ෂික වාර්තාවේ අරමුණයි.

පනතේ විධිවිධාන ප්‍රකාරව 2012 වර්ෂයේදී වැඩිහිටි ආත්මාභිමානය, ස්වාධීනත්වය, සහභාගීත්වය, රැකවරණය ආරක්ෂාකිරීම උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර වඩාත් ඵලදායී සේවාවක් ඉටුකිරීමට ලැබීමද වාසනාවකි.

තවද මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළින් ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම උදෙසා අතීත උරුමයේ කොටස්කරුවන් වූ වැඩිහිටියන් අතරින් අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් දහසක ප්‍රධානයක් ලබාදෙමින් තෘප්තිමත් වැඩිහිටිවියක් උදෙසා කැපවීම සතුටට කාරණයකි.

විධායක වාර්තාව

2012 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය උදෙසා කැපවී ක්‍රියා කළ අතර ඒ නිසාම 2012 වසරේ සැලසුම් කළ පරිදිම සාර්ථක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වැඩසටහන් අතර මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දහසක ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර අභියෝග ජය ගැනීමට ගරු සමාජ සේවා අමාත්‍යතුමාගේත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේත් මහ පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යයමණ්ඩල මේ පිළිබඳව දක්වන උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලයද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විෂය සම්බන්ධ රාජකාරී අවරණය කරන නිලධාරී පිරිසට විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

මෙම ක්‍රියාවලය ඉටුකිරීමෙහිලා කැපවීමෙන් අධිෂ්ඨානයෙන් 2012 වර්ෂය කාර්යයසාධනීය ඉලක්ක සපුරා ගන්නා ලද අතර ඒ සම්බන්ධ සියළු තොරතුරු ඇතුළු පිටුවල ඇතුලත් කර ඇත.

හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදුවූ සමාජ, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය, පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස උපත් අනුපාතය පහත වැටී අපේක්ෂිත ආයු කාලය ඉහළ යාම නිසා මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්තමානයේ 12.2% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 22% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුභසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියාකරයි. 2012 වර්ෂයේදී වැඩිහිටි ප්‍රජාව බලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ග්‍රාමීය වැඩිහිටි කමිටු, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය ලියාපදිංචි කිරීම, වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණුකිරීම ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමගින් වැඩිහිටියන් හුදකලාවීම වලක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්, කායික, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමත් අපගේ අභිප්‍රාය වේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ

පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරි, ජවසම්පන්න හා

ඵලදායි වැඩිහිටි දිවියක් උදාකිරීම

මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්මපරිපූර්ණත්වය, සහභාගීත්වය හා

අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි

වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා

දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්

වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්

අපගේ මෙහෙවරවේ.

සංවිධාන සැලැස්ම


වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
අධ්‍යක්ෂ (1)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) (1)
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (1)
නීති උපදේශක (1)
ගණකාධිකාරී (1)
පරිපාලන නිලධාරී (1)
වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර -98
වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර -2
කළමණාකාර සහකාර (1)
කළමණාකාර සහකාර (2)
කළමණාකාර සහකාර (1)
කළමණාකාර සහකාර (2)
රියදුරු (2)
කා.කා.ස (1)
කා.කා.ස (1)
කා.කා.ස (1)

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2012



	නම	තනතුර
1.	ඉමෙල්ඩා සුකුමාර් මිය	සභාපති
2.	එන්. කේ. අබේරත්න මිය	උප සභාපති
3.	ජේ. ක්‍රිෂ්ණමූර්ති මිය	ලේකම්
4.	වී. ජෙගරාසසිංගම් මිය	කමිටු සාමාජික
5.	ධර්මසිරි පීරිස් මයා	කමිටු සාමාජික
6.	ගරු. එස්. එස්. විජේරත්න මයා	කමිටු සාමාජික
7.	වෛද්‍ය අනිල් දිසානායක මයා	කමිටු සාමාජික
8.	ඩබ්ලිව්. බී. කන්නන්ගර මයා	කමිටු සාමාජික
9.	තිලක් ද සොයිසා මයා	කමිටු සාමාජික
10.	ගීතා විමලවීර මෙය	කමිටු සාමාජික
11.	පී. බණ්ඩාරනායක මයා	කමිටු සාමාජික
12.	පී. ඩබ්ලිව්. තිලකරත්න බණ්ඩා මයා	කමිටු සාමාජික
13.	ඒ. ඇබ්ඩෝන් සිල්වා මයා	කමිටු සාමාජික
14.	කේ. ඒ. ගුණදාස පෙරේරා මයා	කමිටු සාමාජික
15.	පී. එච්. සිරිපාල මයා	කමිටු සාමාජික

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව - 2012

ශ්‍රී ලංකාවේ වර්තමානයේ මුහුණ දෙන විවිධ සමාජ ආර්ථික ගැටළු හා ප්‍රශ්න අතර මෙරට වැඩිහිටි ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම, සුවිශේෂී ගැටළුවක් වී ඇත. එහෙයින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පැවරෙන සමාජ වගකීම ද දිනෙන් දින වර්ධනය වන බවක් පෙනෙන්නට තිබෙන හෙයින්, අපගේ වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා කාලීනව උපාය මාර්ගික සැලසුම්කරණය හා ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවේ.

ඒ අනුව ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවට නඟමින් පෙර වර්ෂ වලට වඩා පුළුල් ජාතික මෙහෙවරක් 2012 වර්ෂයේ ඉට කරන්නට ලැබීම බලවත් වූ සතුටට කරුණකි.

එහිදී වගකීමෙන් යුතුව සුවිශාල කාර්යභාරයක් ඉටුකරන ලද වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සියළුම සාමාජිකයන් මෙන්ම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලය හා වැඩිහිටි නඩත්තු මණ්ඩලය ද පැසසුමට ලක්විය යුතුය.

එසේම වැඩිහිටියන්ගේ සුභසාධනය හා ඔවුන්ට රැකවරණය සැපයීමේ කාර්යේදී නන් අයුරින් සහය වූ රාජ්‍ය නොවන සංවිධානවලට ද මාගේ කෘතඥතාවය පළකරමි.

ඉමෙල්ඩා සුකුමාර්
ලේකම්
සමාජ සේවා අමාත්‍යාංශය
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව - 2012

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණ හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේදී අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.

1. රු. 1000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව

මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ වයස අවුරුදු 70 ඉක්මවූ ශ්‍රී ලාංකික වැඩිහිටි පුරවැසියන්ගේ රැකවරණය සහ සුභසාධනය සැලසීමේ අරමුණින් 2012 අයවැය යෝජනා යටතේ වැඩිහිටි සුභසාධනය සඳහා අතිරේක ප්‍රතිපාදන රජය විසින් වෙන් කර දෙන ලදී.

වයස අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 174,000කට පමණ 2012 වර්ෂයේදී රු. 1000 දීමනාව ලබා දී ඇත.

2. ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා මූල්‍යාධාර සැපයීම

ග්‍රාමීය වැඩිහිටි කමිටු 376 ක්, ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල 09 ක් හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 01ක් සඳහා රුපියල් මිලියන 2.131 ක මූල්‍යාධාර ලබාදී ඇත.

3. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම

වර්ෂය තුළ රුපියල් මිලියන 0.485 ක වියදමක් දරා වැඩිහිටියන් 20500 කට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කරන ලදී.

4. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් ලබාදීම

2012 වර්ෂය තුළ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 17 ක් සඳහා රුපියල් මිලියන 0.425 ක මුදලක් ලබාදී ඇත.

5. පුහුණු හා දැනුවත්කිරීමේ වැඩසටහන්

ජාතික මට්ටමේ වැඩිහිටි උපදේශන කුසලතා සංවර්ධන දෙදින පුහුණු වැඩමුළු 04 ක් හා සහ ප්‍රාදේශීය මට්ටමෙන් වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 1.98 ක් වැය කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 157 ක් කේන්ද්‍ර කොට ගෙන වැඩිහිටි උපස්ථානය පිළිබඳව දහම් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 785 ක් පැවැත්වීම සඳහා රුපියල් මිලියන 0.785 ක් වැයකරන ලදී.

විශ්‍රාම පූර්ව දැනුවත්කිරීමේ වැඩසටහන් 3 ක් පවත්වා තිබේ. ඒ සඳහා වැයකර ඇති මුදල රුපියල් මිලියන 0.237 කි.

6. නොමිලයේ අක්ෂිකාච හා ශ්‍රවන උපකරණ ලබාදීම

2012 වර්ෂය තුළ වැඩිහිටියන් 1064 දෙනෙකුට වෛද්‍ය නිර්දේශයන්ට අනුව අක්ෂිකාච නිකුත්කර ඇති අතර, 26 දෙනෙකුට ශ්‍රවන උපකරණ ලබාදී තිබේ. වැයූ වූ මුදල රුපියල් මිලියන 5.212 කි.

7. **ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම**

"සුවසෙත තුලින් දීර්ඝායුෂ" යන තේමාව යටතේ 2012 වැඩිහිටි දින සැමරුම් උත්සවය, 2012.10.01 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිවයිනේ නන් දෙසින් පැමිණි වැඩිහිටියන් පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුන අතර, ඒ සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 1.013 කි.

8. **වැඩිහිටි නිවාසවලට මූල්‍යාධාර ලබාදීම**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පාලක සභාව විසින් කළමනාකරණය කරනු ලබන කතරගම වැඩිහිටි නිවාසය හා සංචාරක නිකේතනය සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1.319 ක මුදලක් වැයකර තිබෙන අතර, වැඩිහිටියන් 35 දෙනෙකු එහි නේවාසික රැකවරණය ලබා ඇත.

9. **වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන**

දානපතියන්ගේ පරිත්‍යාග තුලින් 2012 වර්ෂයේදී එක් අයකුට මසකට රුපියල් 250/- ක් වන පරිදි වැඩිහිටියන් 162 දෙනෙකුට අඛණ්ඩව මුදල් ආධාර ලබාදීමට හැකිවී තිබේ.

10. **ප්‍රකාශන එළි දැක්වීම**

වර්ෂය තුලදී හැඳුනුම්පත් 150,000ක් මුද්‍රණය කරන ලදී.

මේ සඳහා දරණ ලද මුළු වියදම රුපියල් මිලියන 0.570 කි.

11. **වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලය 48 වාරයක් රැස්වී ඇති අතර, වැඩිහිටියන්ගෙන් ලැබුනු පැමිණිලි 150 ක් අතරින් පැමිණිලි 69 ක් විසඳා අවසන් කරන ලදී. ඒ අනුව නඩත්තු මණ්ඩලයේ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රුපියල් මිලියන 0.474 ක් වැයකොට ඇත.

12. **වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

2012 වර්ෂයේදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත. වැයවූ මුදල රුපියල් මිලියන 0.733 කි.

2012 වර්ෂය සඳහා ප්‍රාග්ධන සහ පුනරාවර්ථන වියදම් යටතේ රු. මිලියන 78.190 ක ප්‍රතිපාදන වෙන්කරන ලද නමුත්, අක්මුදල් වශයෙන් ලැබී තිබෙන්නේ රු. මිලියන 65.790 ක් පමණී. එම නිසා 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත ආකාරයෙන් කාර්ය සාධනය සපුරා ගැනීම දුෂ්කර විය.

කෙසේ නමුත්, 2012 වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් සඳහා ලැබුනු රු. මිලියන 56.290 ක මුදලින් රු. මිලියන 14.57 ක් වැඩිහිටි සුභසාධන කටයුතු සඳහා ඍජුව වැය කර ඇත.

පී.කේ.එස්. සුභෝදිනී
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2012 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය

වැඩිහිටි නිවාස අළුත්වැඩියා සඳහා ආධාර සැපයීම

පළාත	වැඩිහිටි නිවාසය	අවශ්‍යතාව	ගෙවන ලද මුදල (රු.)
බස්නාහිර	සෙත්සෙවණ රජයේ වැඩිහිටි නිවාසය, මීරිගම.	ගෙබිම ටයිල් කිරීම	550,000.00
සබරගමුව	වලල්ගොඩ සරණ සෙවන වැඩිහිටි නිවාසය.	ගිලන් කාමරය ඉදිකිරීම.	998,000.00
උතුරු මැද	නල්ලංචිය වැඩිහිටි දිවා මධ්‍යස්ථානය, ගල්නෑව	වැසිකළිය ඉදිකිරීම.	508,369.58
දකුණු	කටුවන ලියනපතිරණ වැඩිහිටි නිවාසය	වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම.	306,626.91
	සරණ අන්ධ වැඩිහිටි නිවාසය, හම්බන්තොට	තාප්පය අළුත්වැඩියා කිරීම.	345,721.86
මධ්‍යම	රංගිරි දඹුලු වැඩිහිටි නිවාසය,	ආරක්ෂිත තාපය ඉදිකිරීම.	300,000.00
	සරණ වැඩිහිටි නිවාසය, ගුරුළුපොත.	තාප්පයේ ඉතිරි කොටස ඉදිකිරීම	700,000.00
ඌව	කතරගම වැඩිහිටි නිවාසය	මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම.	48,692.83
	කතරගම වැඩිහිටි නිවාසය	කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම.	134,134.90
	පිළිසරණ වැඩිහිටි නිවාසය, මොණරාගල.	ඉඩම වටා වැට ඉදිකිරීම.	487,351.92
උතුරු	කයිතඩි වැඩිහිටි නිවාසය, යාපනය.	භාවනා මධ්‍යස්ථානය ඉදිකිරීම	1,311,000.00
නැගෙනහිර	මුස්ලිම් වැඩිහිටි නිවාසය, කාත්තන්කුඩි	මායිම් තාප්පය ඉදිකිරීම	200,000.00
	උත්තලපුර සරණ වැඩිහිටි නිවාසය, දෙහිඅත්තකණ්ඩිය	මුළුතැන්ගෙය ඉදිකිරීම	899,800.00
වයඹ	ඩී. එම් ද සිල්වා වැඩිහිටි නිවාසය, පොතුවිල.	ළිඳ සෑදීම	670,000.00
	පියභාරතී අනුනාහිමි අනුස්මරණ වැඩිහිටි නිවාසය, කබලෑව.	දානශාලාව ඉදිකිරීම	330,000.00
එකතුව			**7,789,637.14**

වැඩිහිටි හැඳුනුම්පත් නිකත් කිරීම හා ඒ සඳහා පවත්වන ලද ජංගම සේවාවන් - 2012

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	හැඳුනුම්පත් සංඛ්‍යාව	මුදල
බස්නාහිර	කොළඹ	කොළඹ	55	රු. 1,375/-
		කොලොන්නාව	78	රු. 1,950/-
		හෝමාගම	107	රු. 2,675/-
		පාදුක්ක	218	රු.6,540/-
		මහරගම	23	රු.575/-
		ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	52	රු. 1,300/-
		තිඹිරිගස්යාය	202	රු.5,050/-
		දෙහිවල -ගල්කිස්ස	103	රු.2,575/-
		රත්මලාන	43	රු.1,075/-
	කළුතර	ඉංගිරිය	153	රු.3,825/-
		කළුතර	444	රු.11,100/-
	ගම්පහ	මීගමුව	223	රු.5,575/-
		දිවුලපිටිය	495	රු.12,375/-
		මීරිගම	39	රු.975/-
		ගම්පහ	143	රු.3,575/-
		දොම්පෙ	328	රු.8,200/-
		බියගම	31	රු.775/-
මධ්‍යම	මහනුවර	පූජාපිටිය	288	රු.7,200/-
		අකුරණ	145	රු.3,725/-
		මැදදුම්බර	564	රු.14,100/-
		කුණ්ඩසාලේ	223	රු. 5,575/-
		හතරලියැද්ද	101	රු.2,525/-
		උඩුනුවර	107	රු.4,280/-
		උඩපළාත	79	රු.1,975/-
	නුවරඑළිය	කොත්මලේ	372	රු.9,300/-
		හඟුරන්කෙත	278	රු.6,950/-

		අඹගමුව කෝරළය	1228	රු.30,700/-
දකුණු	ගාල්ල	බද්දේගම	28	රු.700/-
		ඉමදූව	241	රු.6,025/-
		හබරාදූව	116	රු.2,900/-
	මාතර	මුලටියන	235	රු.5,875/-
		වැලිපිටිය	369	රු.9,225/-
		හක්මන	215	රු.5,375/-
		කිරින්ද - පුහුල්වැල්ල	230	රු.5,750/-
	හම්බන්තොට	බෙලිඅත්ත	179	රු.4,475/-
උතුරු	මන්නාරම	නානාට්ටාන්	273	රු.8,190/-
නැගෙනහිර	මඩකලපුව	කෝරළේපත්තු මධ්‍යම	105	රු.2,725/-
	අම්පාර	මහඔය	131	රු.3,275/-
		අම්පාර	262	රු.6,550/-
		තින්දවූර්	20	රු.500/-
		ලාහුගල	355	රු.8,875/-
වයඹ	කුරුණෑගල	ඉබ්බාගමුව	361	රු.9,025/-
		කුරුණෑගල	165	රු.4,125/-
		මාවතගම	47	රු.1,175/-
		නාරම්මල	413	රු.10,325/-
	පුත්තලම	මුන්දලම	193	රු.4,825/-
		ආණමඩුව	109	රු.2,725/-
		දන්කොටුව	82	රු. 2,050/-
උතුරු මැද	අනුරාධපුරය	ගලෙන්බිඳුණුවැව	197	රු.4,925/-
		මිහින්තලේ	307	රු.7,675/-
		නාච්චාදූව	841	රු.21,025/-
		නොච්චියාගම	59	රු.1,475/-
		තඹුත්තේගම	356	රු.8,900/-
		ඉපලෝගම	196	රු.4,900/-

		ගල්නෑව	101	රු.2,525/-
	පොලොන්නරුව	මැදිරිගිරිය	124	රු. 3,100/-
ඌව	බදුල්ල	සොරණාතොට	74	රු.1,850/-
		බදුල්ල	245	රු.6,225/-
		වැලිමඩ	55	රු. 1,375/-
	මොණරාගල	මැදගම	265	රු.6,625/-
		බඩල්කුඹුර	446	රු.11,150/-
සබරගමුව	කෑගල්ල	අරණායක	452	රු.11,300/-
		යටියන්තොට	249	රු.6,225/-
		දෙහිඕවිට	371	රු.9,275/-
		දැරණියගල	645	රු.16,110/-
	රත්නපුර	ඉඹුල්පේ	312	රු.7,800/-
		පැල්මඩුල්ල	61	රු.1,525/-
		වැලිගෙපොල	722	රු. 18,050/-
		ඇඹිලිපිටිය	80	රු.2,000/-
		කොලොන්න	318	රු.7,950/-
එකතුව			**16730**	**රු. 419,925**

වැඩිහිටි කමිටු පිහිටුවීම හා රු. 5,000 ආධාර ලබාදීම - 2012

පළාත	දිස්ත්‍රික්කය	රු. 5000 ආධාර ලබාදුන් කමිටු සංඛ්‍යාව
බස්නාහිර	කළුතර	22
	කොළඹ	22
	ගම්පහ	11
මධ්‍යම	මහනුවර	43
	මාතලේ	16
දකුණු	ගාල්ල	36
	මාතර	13
	හම්බන්තොට	03
උතුරු	යාපනය	04
	වවුනියා	05
	කිලිනොච්චි	15
නැගෙනහිර	මඩකලපුව	12
	අම්පාර	25
	ත්‍රිකුණාමලය	08
වයඹ	පුත්තලම	25
	කුරුණෑගල	65
සබරගමුව	රත්නපුර	12
	කෑගල්ල	22
ඌව	මොණරාගල	06
	බදුල්ල	13
එකතුව		378

රු. 7,500 මූල්‍යමය ආධාර ලබාදෙන ලද ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල - 2012

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
කොළඹ	කළුතර	01
දකුණ	ගාල්ල	02
	මාතර	01
	හම්බන්තොට	01
සබරගමුව	රත්නපුර	01
උතුරු මැද	අනුරාධපුර	01
මධ්‍යම	මහනුවර	01
ඌව	මොණරාගල	01
එකතුව		09

රු. 15,000 මූල්‍යමය ආධාර ලබාදෙන ලද දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩල - 2012

පළාත	දිස්ත්‍රික්කය
බස්නාහිර	කොළඹ
වැඩසටහනක් වෙනුවෙන්	

දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර මුදල් ලබාදීම - 2012

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	උපකරණ මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම	
			මධ්‍යස්ථාන සංඛ්‍යාව	මුදල රු.
බස්නාහිර	කළුතර	හොරණ	02	50,000
දකුණ	මාතර	බෙලිඅත්ත	01	25,000
වයඹ	කුරුණෑගල	කුලියාපිටිය නැගෙනහිර	03	75,000
		උඩුබද්දාව	01	25,000
සබරගමුව	කෑගල්ල	කෑගල්ල	01	25,000
	රත්නපුර	රත්නපුර	01	25,000
		ඇහැලියගොඩ	01	25,000
මධ්‍යම	නුවරඑළිය	අඹගමුව කෝරලය	02	50,000
		නුවරඑළිය	01	25,000
ඌව	බදුල්ල	සොරණාතොට	01	25,000
උතුර	වවුනියා	වවුනියා	01	25,000
	මන්නාරම	නානාට්ටන්	01	25,000
නැගෙනහිර	අම්පාර	සමන්තුරෙයි	01	25,000
එකතුව			17	**425,000**

විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම - 2012

පවත්වන ලද ස්ථානය	වැඩමුළු ප්‍රමාණය	ප්‍රතිලාභීන්	මුදල (රු.)
කොබ්බෑකඩුව, ගොවි කටයුතු හා පුහුණු පර්යේෂණ ආයතනය	01	280	308,337.00
එකතුව	**01**	**280**	**308,337.00**

ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවාව - පුහුණු කිරීමේ වැඩසටහන

වැඩිහිටියන් සඳහා අවශ්‍යවන්නා වූ රැකවරණය හා හෙද සත්කාරක සෙවා ලබාදිමේ අරමුණෙන් වැඩිහිටි රැකවරණ ස්වේච්ඡා සේවකයන් පුහුණු කර සේවයේ යෙදවීමේ වැඩසටහනක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත. ඒ අනුව තෝරාගන්නා ලද 135 ක පිරිසක් හට වැඩිහිටියන් රැකබලාගැනීම හා ඔවුන්ට සෞඛ්‍යමය සේවා සැපයීම පිළිබඳව සති තුනක විධිමත් පුහුණුවක් ලබාදී ඇති අතර, මේ වන විට විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ ජීවත් වන අවශ්‍යතාවය ඇති වැඩිහිටියන්ට ඔවුන්ගේ සේවය ලබාගැනීමේ මාහැඟි අවස්ථාව උදාවී තිබේ. ඒ සඳහා දිවා කාලයේ පැය 08 ක වැඩමුරයකට රු. 600.00 බැගින් නියමිත ගාස්තුවක් පමණක් අයකරනු ලැබේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සේවාව සපයන අතර, සේවාලාභීන්ගේ අවශ්‍යතාවය පරිදි කාන්තා හෝ පිරිමි සේවාදායකයකු ලබාගත හැකිය. එසේම සේවයේ යොදවන සියලු වැඩිහිටි සත්කාරකයන් ආචාර ධර්ම පද්ධතියකට යටත්ව කටයුතු කරති.

සමාජ සේවා අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව පුහුණු වැඩසටහන සැලසුම්කර මෙහෙයවන අතර, පුහුණුව සාර්ථකව අවසන්කරන පුහුණුවන්නන්ට විධිමත් සහතික පත්‍රයක් හා හැඳුනුම්පතක් නිකුත්කරනු ලැබේ. එහෙයින් වඩාත් විශ්වාසයකින් යුතුව එකී රැකවරණ ස්වේච්ඡා සේවකයන්ගේ සේවය ලබාගැනීමට හැකිවී ඇත.

මෙකී වැඩපිළිවෙල නිසා වැඩිහිටියන්ට හා ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව රජය පිළිගත් පුහුණුවකින් පසු වටිනා සහතිකයකට හිමිකම් ලැබීම හා ස්වාධීන උපස්ථායකයකු ලෙස සේවය කරමින් ආදායම් ඉපයීමට හැකිවීම නිසා වැඩිහිටි රැකවරණ ස්වේච්ඡා සේවක පුහුණුව ලැබූවන් හට ද යහපතක් සැලසී තිබේ.

දැනට බස්නාහිර පළාත කේන්ද්‍රකොට ගෙන මෙකී වැඩිහිටි රැකවරණ ස්වේච්ඡා සේවාව ක්‍රියාත්මක වුවද ඉදිරියේදී අනෙකුත් පළාත් වලට ද එය ව්‍යාප්ත කිරීමෙන් සේවා අවශ්‍ය වැඩිහිටියන් සඳහා වඩාත් පුළුල් සේවාවක් ලබාදීමට අදහස්කර තිබේ.

2012 වර්ෂයේදී ගෘහස්ථ වැඩිහිටි සත්කාරක සේවකයින් පුහුණු කිරීම පහත සඳහන් පරිදි වේ.

කණ්ඩායම	ප්‍රතිලාභීන් ගණන	මුදල (රු.මිලියන)
6 කණ්ඩායම	30	0.239

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් අරඹා කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර, එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබාදෙන මුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රු. 250/- බැගින් ලබාදීමට කටයුතු කර තිබේ. ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේදී මාස 04 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 1,000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදුකරනු ලබන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබාදීම සිදුකරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී/ සමාජ සේවා නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සොයා බලනු ලබන අතර, ප්‍රතිලාභීන්ට මුදල් ලබාදෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ට දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කිහිප දෙනෙකු තෝරාගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත. එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර, ප්‍රතිලාභියාගේ නම, ලිපිනය ඇතුළත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදීමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදීමට කැමති අයෙකු වේ නම්, නුගේගොඩ ලංකා බැංකුවේ අංක 5234881 දරණ වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර, එසේ මුදල් තැන්පත් කිරීමේදී මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය. එසේත් නොමැති නම්, අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැකිය.

මෙම වැඩසටහන අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තව දුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව, 2012 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්, ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

අංකය	දායකයාගේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභියාගේ නම	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
1	ඩබ්ලිව්. යමුනා චිත්‍රාංගනී මෙය	11	අයි. සී. මැගිලින් ප්‍රනාන්දු මිය	ඉබ්බාගමුව
			ආර්.වයි.ජී. ගුණවතී මිය	ගලගෙදර
			එච්. ජයවතී මිය	බුලත්සිංහල
			ජ්.සී. කමලාවතී මිය	බුලත්සිංහල
			ඩබ්.පී. ලීලාවතී මිය	තිස්සමහාරාමය
			ඩී.බී. ජේන්නෝනා මිය	රිදීගම
			විනී ප්‍රනාන්දු මයා	පානදුර
			ජ්. ජී. ධර්මවර්ධන මයා	දැරණියගල
			ජ්. ඩබ්. මැගිලින් රුදිගු මිය	මාස්පොත
			ජී. තේරේසා ඩිලෙක් මිය	කැලණිය
			එම්.ජී. ඩිංගිරිඅම්මා මිය	කුණ්ඩසාලේ-මැණික්හින්න
2	ආනන්ද තිලකසිරි මයා	10	එම්. ජ්. ඥානවතී මිය	සෙවණගල
			ආර්. එම්. ඩිංගිනා මිය	සෙවණගල
			එම්. පී. අතගී මිය	මිනුවන්ගොඩ
			යූ. ජී. ඩිංගිරිමැණිකේ මිය	උඩුගම්පොල
			ජ්. ඩබ්. පී. බෙබිනෝනා මිය	දෙවිනුවර
			එම්. වී. පියසේන මයා	දෙවිනුවර
			ජ්. ඩබ්. පී. කුසුමාවතී මිය	දෙවිනුවර
			තම්බිමුත්තු ඉලේතම්බි මයා	සමන්තුරෙයි
			අබුරන් මුඩියප්පු මයා	ඩෙල්ෆ්
			එම්. පී. ලිලී මිය	කැලණිය
3	එඩ්වඩ් පෙරේරා මහතා	08	ඩී. ජී. පී. එම්. රංදොහාමි මිය	පඩුවස්නුවර බටහිර
			කේ. එම්. රංදොහාමි මිය	පඩුවස්නුවර බටහිර
			ජේ. ජ්. විතිප්‍රිඩා පෙරේරා මිය	කළුතර
			පී. ජ්. පියසේන මයා	කාර්යාලයට පැමිණ මුදල් ලබා ගනී
			ඩී. බී. දනෝරිස් මයා	සෙවනගල
			ජ්. ඩී. ඩේලින් සිංඤෝ මයා	සෙවනගල
			එස්. හුරතලී මිය	කොලොන්න
			ජ්. එම්. බණ්ඩාර මැණිකේ මිය	මාවතගම
4	ජ්. බී. පෙරේරා මහත්මිය	01	එම්.ජ්. සේනන් සිඤ්ඤෝ මයා	නිට්ටඹුව
5	ජේ.ජ්. ඩී. ලෙනාඩ් රෝහණ මහතා	01	ජේ. ජ්. ඩී. එමලින් නෝනා මිය	බියගම
6	සෝමා කුලතුංග මිය	03	ජ්. අන්තෝනි මයා	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

අංකය	දායකයාගේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභියාගේ නම	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
			ඊ. වයලට්නෝනා මිය	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
			කේ. ඒ. පොඩිහාමිනේ මිය	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
7	ජයන්ත පිංචිහේවා මයා	01	කේ. මේරිනෝනා මිය	කැස්බෑව
8	ලලනි පෙරේරා මිය	02	කේ. එම්. බණ්ඩාර මැණිකේ මිය	පතන හේවා සැට
			ඩබ්. දිනුහාමි මිය	පොල්පිතිගම
9	එස්. ප්‍රසංගිකා සිල්වා මිය	01	එම්. එම්. අබේරත්න මයා	තඹුත්තේගම
10	එම්.එස්.ඒ. හින්ටිඩ් මිය	08	ජී.ආර්. සාදිනෝනා මිය	වරකාපොල
			අයි.ජී. සොයිදා මිය	වරකාපොල
			එච්.පී. පොඩිනෝනා මිය	වරකාපොල
			ඩබ්.එච්. ලිලියා මිය	වරකාපොල
			ජේ. පී. ලැයිසා මිය	වරකාපොල
			ඒ. සිමියොන් මයා	මීගමුව
			ඒ. අමරසිරි ද සිල්වා මයා	මීගමුව
			ජේ.එම්. ඇඩ්මන් මයා	මීගමුව
11	එන්. ඒ. ප්‍රනාන්දු මහත්මිය	06	එම්. පීටර් පෙරේරා මයා	මීගමුව
			ආර්. ඒ. කුසුමාවතී මිය	මීගමුව
			ඒ. හේමපාල පෙරේරා මයා	මීගමුව
			ඩබ්. ඩී. ධර්මදාස මයා	මීගමුව
			ඒ. වික්ටර් මයා	මීගමුව
			කේ. බී. ඇසිලින් නෝනා මිය	මීගමුව
12	ඩී. තම්මිතේගම මයා	04	එම්. ඩී. ලීලාවතී මිය	මහකුඹුක්කඩවල
			ආර්. ඩී. පිනී මිය	ගිරිබාව
			එච්. එම්. හාමිනෝනා මිය	ගිරිබාව
			ආර්. එම්. ඥානලතා මිය	පොල්ගහවෙල
13	ආර්.එම්. කුසමා කුමාරිහාමි මිය	01	ඒ. සුමනාවතී මිය	මිහින්තලේ
14	ඩබ්. එම්. වත්සලා මිය	01	ජී. අස්පතියේගෙදර මයා	වත්තේගම
15	ඒ. එම්. ආර්. ඒ. ජයසුන්දර මිය	01	ආර්. ඇගිනෝනා මිය	කඩුවෙල
16	නන්දා කරුණාසේන මිය	01	එල්. ඒ. හීන්හාමි මිය	කැලණිය
17	සුනිලා පෙරේරා මිය	01	අයි.දෝන ඇග්නස් මිය	කැලණිය
18	තරංගා කරුණාසේන මිය	01	අයි. ඇන්සිනෝනා මිය	කැලණිය
19	එම්. පී. ගුණදාස මිය සහ එම්. ඩී. අයි. යූ. ගුණදාස මෙය	02	ඒ. සෝමා ගුණවර්ධන මිය	මිනුවන්ගොඩ
			එම්. පී. විපුලසේන මයා	මිනුවන්ගොඩ
20	කේ. පී. නිශාන්ත මයා	01	එම්. පී. ඇසිලින් නෝනා මිය	දොම්පෙ
21	එම්. එස්. එම්. අජ්රොෆ් මයා	01	අබ්දුල් රස්වාන් මයා	කළුතර
22	සීලා පියසිංහ මිය	01	එච්. එම්. හේරත්මැණිකේ මිය	ඉබ්බාගමුව

අංකය	දායකයාගේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභියාගේ නම	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
23	ඉන්ද්‍රානි සෙනවිරත්න මිය	01	යසවතී වෙත්තසිංහ මිය	මහරගම
24	දිලූපා කරුණාරත්න මහත්මිය	01	නෝබට් විමලරත්න මයා	පිළියන්දල
25	විනීතා මල්ලිකා මහත්මිය	01	පී. ඒ. සුමනා පෙරේරා මිය	තිඹිරිගස්යාය
26	ඩී. පී. වික්‍රමාරච්චි මහත්මිය	01	එම්. තුසිත රත්න සිල්වා මයා	බලපිටිය
27	හවීන්ද්‍ර කල්දේරා මහතා	02	එච්. බී. පින්සොහාමි මිය	මාලිම්බඩ
			ඩබ්. පී. ගුණවතී මෙනවිය	කුණ්ඩසාලේ

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2012

වර්ෂය	මාසය	කාමර වෙන් කල ප්‍රමාණය	ආදායම රු.	වියදම්		
				ජල බිල්පත් රු.	විදුලි බිල්පත් රු.	පවිත්‍ර රු.
2012	ජනවාරි	21	15,900.00			
		12	13,400.00	18,088.00	2,619.00	6,700.00
	පෙබරවාරි	29	21,000.00			
		11	10,000.00	8,181.60	1,260.23	7,500.00
	මාර්තු	13	10,200.00			
		2	2,800.00	7,963.20	2,385.00	15,500.00
	අප්‍රේල්	35 (F.H. සමග)	38,700.00	5234.90	3,750.00	15,500.00
		7	6,700.00			
	මැයි	28	26,400.00			
		4	2,400.00	5,931.00	2,214.38	15,500.00
	ජුනි	16 (F.H. සමග)	20,100.00	9,273.60	2,775.00	15,500.00
		2	2,000.00			
	ජුලි	17	12,900.00	8,108.80	922.50	15,500.00
	අගෝස්තු	41 (F.H. සමග)	42,400.00	6,944.00	4,700.00	15,500.00
		7	6,400.00			
	සැප්තැම්බර්	27	26,000.00	14,968.80	1,970.63	15,500.00
	ඔක්තෝම්බර්	26(F.H. සමග)	31,300.00	7,526.40	2,701.88	15,500.00
	නොවැම්බර්	12(F.H. සමග)	12,800.00			
		1	700.00	8,550.00	2,043.75	15,500.00
	දෙසැම්බර්	40(F.H. සමග)	34,800.00	12,980.80	2,701.88	15,500.00
	එකතුව		336,900.00	113,751.20	30,044.88	169,200.00

(කාර්යාලයෙන් කාමර වෙන් කිරීම රු. 44,400.00 යි)

ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 2007 ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එය 2008 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා පත්කර ගනු ලබන වයස අවුරුදු 70 ඉක්ම වූ තම දරුවන් ඥාතීන් විසින් නොසලකා හැර ඇති, රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු විශ්‍රාම වැටුප්, අර්ථ සාධක අරමුදල්, ගොවි ධීවර හෝ ස්වයං රැකියා විශ්‍රාම වැටුප් හෝ වෙනයම් සමාජ රක්ෂණ යෝජනා ක්‍රමයක දායකත්වය නොලබන ඉතා අසරණ වූවන් මේ සඳහා දායක කරගනු ලබන අතර, දිගුකාලීන අසනීප හා ආබාධ සහිත පුද්ගලයන් තම ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් ලෙස රුපියල් මිලියන 03 ක මුදලක් (රු. 3,000,000) සුපිරි වාසනා ලොතරැයි අරමුදලින් ලබාදී ඇති අතර, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් එකී මුදල ආයෝජනය කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මසකට රු. 500/- බැගින් ප්‍රතිලාභීන් 89 දෙනෙකු සඳහා මෙම ප්‍රතිලාභ ලබාදෙන ලදි.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සභාපති ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්යය භාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති, වයස අවුරුදු 60 ඉක්මවූ, වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබාදීමය. ඒ අනුව, මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවකදී, මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව දෙපාර්ශවයම කැඳවා, කරුණු විමසා පරීක්ෂණයක් සිදුකොට, දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියමකිරීම සිදුකරනු ලබයි. එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්, යැපීම් අවශ්‍යතා ආදී සියලු සාධක සැලකිල්ලට ගැනීම සිදුකරනු ලබයි.

මෙහිදී දෙමාපියන්ට නඩත්තු ඉල්ලීමේදී තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදාගන්නා ලද දරුවන්ගෙන්ද (Adopted Child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත. තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තුව සපයාගැනීමට නොහැකි ලෙස ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම්, මෙම පනතේ 25(IV) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලාසිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත්කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සපයා ඇත.

නමුත්, මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපළ සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටලු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබාදෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමුකිරීමේ හැකියාව පවතී. එහිදී මහේස්ත්‍රාත්වරයෙකුට එම නියෝගය නඩත්තු ආඥා පනත යටතේ කරනලද ආඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2012

පෙර වර්ෂයේ ඉතිරි පැමිණිලි	-	48
2012 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි	-	289
		↓
ප්‍රමාණවත් විස්තර ලැබී නොමැති පැමිණිලි	-	86
ඉඩම් පවුල් ආරවුල් වැනි අදාල නොවන පැමිණිලි	-	33
ඒ අනුව අවසානය තෙක් විභාග කළ පැමිණිලි	-	----------
		218
		======

මණ්ඩල විසින් සමථයට පත් කළ පැමිණිලි	-	62	218
විවිධ හේතූන් මත නිශ්ප්‍රභා කළ හා ඉඩ ලබාදිය නොහැකි පැමිණිලි	-	21	
ඉල්ලා අස්කරගන්නා ලද පැමිණිලි	-	08	
දැනට විභාග වෙමින් පවතින පැමිණිල	-	127	

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයන්

සභාපති	-	ඩඩ්ලි කරුණාරත්න මයා
ලේකම්	-	එස්. අමරකෝන් මයා

මණ්ඩලයේ සාමාජික

1. මහාචාර්ය වයි. රාසනායගම් මිය
2. ටී. පෙරින්පනායගම් මයා
3. ඒ. සී. එම්. එම්. ෆාලීල් මයා
4. එච්. එස්. එල්. රාජපක්ෂ මයා

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුම් ප්‍රතිපත්ති

පොදු ගිණුම් ප්‍රතිපත්ති

(අ) මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඒවා පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතින් අනුව පිළයෙල කර ඇත.

(ආ) රජයේ ප්‍රදානයන්

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලැබුනුයේ මහභාණ්ඩාගාරයෙන් වන අතර, මෙම ආයතනය වෙළඳ නොවන ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

මහභාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු ලබන අතර, මූලධන වියදම් සඳහා දෙනු ලබන ප්‍රදානයන් මූලධන ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කෙරේ.

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම්

(අ) ක්ෂය ප්‍රතිපත්ති

I. මිළදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය ගණනය කරනු ලබන අතර අවසන් කරන වර්ෂයට ක්ෂය ගණනය කරනු නොලැබේ.

II. පහත පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර ඇත.

වාහන සඳහා	-	10%
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සඳහා	-	15%
යන්ත්‍රෝපකරණ හා සවිකිරීම සඳහා	-	20%

III. වැඩිහිටි නිවාස අලුත්වැඩියාකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා දරණ ලද රුපියල් 11,414,732.70 ක වියදම් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට අයත් නොවන බැවින් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරනු නොලැබේ.

(ආ) ප්‍රාග්ධන හා පුනරාවර්ථන අරමුදල් ලැබීම් මූල්‍ය වාර්තාව තුළ ඇතුලත් කොට ඇත.

(ඇ) සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් වැටුප් ලෙස රුපියල්. 1,626,420/- ක ගෙවන නිලධාරීන් 7 දෙනෙකු මෙම ආයතනයේ සේවය කරනු ලබයි.

(ඈ) ස්ථාවර වත්කම් යටතේ පෙන්වන ලද (ලී බඩු හා කාර්යාලීය උපකරණ) වත්කම් වලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතී.

ඇමුණුම - 1 ඒ

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

2011 (රු.)	විස්තරය	සටහන	පිරිවැය 2012 (රු.)	ක්ෂය වීම සඳහා ප්‍රතිපාදනය 2012 (රු.)	2012 (රු.) ශුද්ධ වටිනාකම
	ස්ථාවර වත්කම්				
2,896,159.52	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ		7,644,348.47	5,639,445.53	2,004,902.94
6,700,000.00	වාහන		16,550,000.00	2,405,000.00	14,145,000.00
653,907.00	යන්ත්‍රෝපකරණ හා සවිකිරීම්		2,441,309.00	1,863,904.20	577,404.80
10,250,066.52			**26,635,657.47**	**9,908,349.73**	**16,727,307.74**
4,810,482.93	ස්ථාවර තැන්පත්				5,219,373.90
	ජංගම වත්කම්				
486,682.50	පරිලේඛන / බඩු තොග	16	442,107.84		
1,000.00	නොපියවූ අත්තිකාරම්	10	1,000.00		
50,800.00	නොපියවූ උත්සව අත්තිකාරම්	11	62,500.00		
130,389.96	නොපියවූ ආපදා අත්තිකාරම්	13	32,597.48		
3,368,579.00	කාර්ය මණ්ඩලය සඳහා ණය	14	3,257,884.00		
743,515.76	මුදල් සහ මූල්‍යමය ප්‍රභවයන්	8	943,849.56	4,739,938.88	
19,841,516.67	**මුළු වත්කම්**				
	වගකීම්				
	ජංගම වගකීම්				
40,000.00	විගණන ගාස්තු වෙන්කිරීම		50,000		
5,432,276.00	පාරිතෝෂික වෙන්කිරීම	15	5,854,110.50		
130,455.72	කාර්ය මණ්ඩලය සඳහා ණය අරමුදල		130,455.72		
1,370,041.46	පොදු තැන්පත්		1,519,310.53		
616,543.37	උපචිත වියදම්	9	9,527,771.61		
(7,982,654.31)	ශුද්ධ වත්කම්			17,081,648.36	(12,341,709.48)
11,858,862.56	**මුළු ශුද්ධ වත්කම්**				**9,604,972.16**
	ශුද්ධ වත්කම් / ස්කන්ධය				
17,829,936.06	සමුච්චිත අරමුදල			16,175,474.46	
(4,316,611.90)	එකතු කලා : පෙර වර්ෂය සඳහා ගැලපුම්			4,403,098.82	
13,513,324.16				11,772,375.64	
(1,654,461.60)	එකතු / අඩු ශුද්ධ අතිරික්තය			(12,176,526.22)	(404,150.58)
	රජයේ ප්‍රදානයන් - (මූලධන)				444,471.46
	භාණ්ඩාගාරයේ ප්‍රදානයන් - (වාහන)				9,100,000.00
	ලෝක සෞඛ්‍ය සංවිධානයේ පරිත්‍යාග	12			104,613.52
393,337.76	වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය				360,037.76
11,858,862.56					
11,858,862.56	**මුළු ශුද්ධ වත්කම / ස්කන්ධය**				**9,604,972.16**

අත්සන්කලේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන්කලේ,
ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම් - 1 බී

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් වාර්තාව

2011 (රු.)	විස්තරය	සටහන	2012 (රු.)	2012 (රු.)
	<u>මෙහෙයුම් ආදායම්</u>			
75,090,000.00	රාජ්‍ය ප්‍රදාන		65,345,528.54	
	අමාත්‍යාංශ ප්‍රදාන		182,379,000.00	
	ලෝක සෞඛ්‍ය සංවිධානය		1,401,166.48	249,125,695.02
-	<u>වෙනත් ආදායම්</u>		-	
417,347.83	ස්ථාවර තැන්පතු පොලිය		408,890.97	
600.00	පරිත්‍යාග		900.00	
505,044.43	විවිධ ආදායම්		772,051.96	1,181,842.93
76,012,992.26				**250,307,537.95**
	<u>මෙහෙයුම් වියදම්</u>			
29,470,577.21	පුද්ගල පඩිනඩි	1	36,167,278.59	
1,313,924.05	ගමන් වියදම්	2	1,831,102.12	
1,785,185.57	සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා	3	1,841,905.30	
658,512.07	නඩත්තු වියදම්	4	376,009.88	
8,706,435.99	ගිවිසුම්ගත සේවා	5	7,762,773.43	
34,179,097.78	වෙනත් මෙහෙයුම් වියදම්	6	211,713,759.87	
1,553,721.19	ක්ෂය ප්‍රමාණය	7	2,791,234.98	
77,667,453.86	**මුළු මෙහෙයුම් වියදම්**			**262,484,064.17**
(1,654,461.60)	අදාල කාලය සඳහා වූ ශුද්ධ ඌණතාවය			**(12,176,526.22)**

අත්සන්කලේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන්කලේ,
ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ඇමුණුම - 1 යි

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වූ
අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය

විස්තරය	2012 (රු.)	2012 (රු.)
<u>මෙහෙයුම් කටයුතු තුලින් වූ අරමුදල් ප්‍රවාහ</u>		
මෙහෙයුම් ක්‍රියාවලින් ලද අතිරික්තය	(12,176,526.22)	
මූල්‍යමය නොවන කාර්යයන්		
ක්ෂය වීම්	2,791,234.98	
වර්තමාන වත්කම්		
වර්ෂ අවසාන තොග අඩුවීම	44,574.66	
වර්තමාන වගකීම්		
පාරිතෝෂික	421,834.50	
සේවක ණය ඉතිරියේ අඩුවීම	110,695.00	
නොපියවූ ආපදා අත්තිකාරම් වැඩිවීම	97,792.48	
නොපියවූ උත්සව අත්තිකාරම් වැඩිවීම	(11,700.00)	
විගණන ගාස්තු වෙන්කිරීම් වැඩිවීම	10,000.00	
විවිධ අත්තිකාරම් වල වැඩිවීම	149,269.07	
උපචිත වියදම් වැඩිවීම	8,911,228.24	
	348,402.71	
පසුගිය වසරේ ගැලපුම් කිරීම්	(86,486.92)	
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**261,915.79**
ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් ශුද්ධ පොලිය	(408,890.97)	
දේපල, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් වල මිලදී ගැනීම්	(9,268,476.00)	**(9,677,366.97)**
මූල්‍ය ක්‍රියාවලි වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රදාන - (මූලධන)	444,471.46	
භාණ්ඩාගාරයේ ප්‍රදාන - (වාහන)	9,100,000.00	
ලෝක සෞඛ්‍ය සංවිධාන අරමුදල	104,613.52	
වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමය	(33,300.00)	**9,615,784.98**
කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්ගේ ශුද්ධ අතිරික්තය		200,333.80
කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්		743,515.76
කාලපරිච්ඡේදය අවසානයේ ඇති මුදල් හා මූල්‍යමය ප්‍රභවයන්		**943,849.56**

අත්සන්කලේ,
ඉමෙල්ඩා සුකුමාර්
සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

අත්සන්කලේ,
ජේ. ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

උප ලේඛන

2011 රු.	සටහන් 1		පුද්ගලික පඩි නඩි	12/31/2012 රු.
17,387,307.38		(I)	වැටුප් හා වේතන	21,063,628.80
2,923,086.68		(II)	සේවක අර්ථසාධක අරමුදල	3,279,334.21
733,960.34		(III)	සේවක භාරකාර අරමුදල	819,833.36
189,156.52		(IV)	අතිකාල	434,119.87
44,589.14		(V)	නිවාඩු දින වැටුප	43,263.18
7,287,423.04		(VII)	ජීවන වියදම් දීමනා	7,364,847.41
905,054.11		(VI)	ජීවන වියදම් දීමනා	3,162,251.76
29,470,577.21			**එකතුව**	**36,167,278.59**

2011 රු.	සටහන් 2		ගමන් වියදම්	12/31/2012 රු.
1,248,344.05		(I)	දේශීය	1,726,508.60
65,580.00		(II)	විදේශීය	104,593.52
1,313,924.05			**එකතුව**	**1,831,102.12**

2011 රු.	සටහන් 3		සැපයීම් හා කාර්යාලීය අවශ්‍යතා	12/31/2012 රු.
1,228,845.27		(I)	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,357,091.05
550,877.50		(II)	ඉන්ධන හා ලිහිසි තෙල්	481,019.25
5,462.80		(III)	නිල ඇඳුම්	3,795.00
1,785,185.57			**එකතුව**	**1,841,905.30**

2011 රු.	සටහන් 4		නඩත්තු වියදම්	12/31/2012 රු.
562,953.07		(I)	වාහන	344,127.59
95,559.00		(II)	යන්ත්‍රෝපකරණ හා සවිකිරීම්	31,882.29
658,512.07			**එකතුව**	**376,009.88**

2011 රු.	සටහන් 5	ගිවිසුම් සේවා	12/31/2012 රු.
19,600.00		(I) ප්‍රවාහන	6,410.00
503,484.73		(II) තැපැල් හා විදුලි සංදේශ සේවා	556,349.49
777,675.89		(III) විදුලිය හා ජලය	880,895.54
3,363,234.16		(IV) බදු කුලී	3,069,345.73
130,275.00		(V) පිරිසිදුකිරීමේ ගාස්තු	150,338.00
75,070.00		(VI) පුවත්පත්	59,705.00
117,899.80		(VII) සංග්‍රහ වියදම්	254,380.76
20,000.00		(IX) විගණන ගාස්තු	74,797.00
212,403.27		(X) ආරක්ෂක වියදම්	264,569.31
501,200.00		(XI) ජාතික සභාව සඳහා දීමනා	409,503.00
736,000.00		(XII) නඩත්තු මණ්ඩලය සඳහා දීමනා	1,103,014.00
1,165,156.14		(XIII) අතිකුත් දීමනා	511,631.10
1,084,437.00		(XIV) පාරිතෝෂිකය	421,834.50
8,706,435.99		එකතුව	**7,762,773.43**

2011 රු.	සටහන් 6	වෙනත් මෙහෙයුම් වියදම්	12/31/2012 රු.
2,132,803.00		(I) ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම	5,685,602.00
693,008.00		(II) හැඳුනුම්පත් නිකුත් කිරීම	571,797.00
734,750.00		(III) දිවා මධ්‍යස්ථාන පිහිටුවීම හා ස්වයං රැකියා ආධාර ලබාදීම	974,389.00
533,618.20		(IV) ප්‍රකාශන	538,847.20
4,284,418.00		(V) පුහුණු වැඩසටහන් හා දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම	1,062,380.00
10,851,494.00		(VI) වෛද්‍ය සායන පැවැත්වීම, අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබාදීම	8,005,650.00
1,347,265.00		(VII) "ජාත්‍යන්තර වැඩිහිටි දිනය" සැමරීම	791,448.00
1,596,835.58		(VIII) වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම	1,247,951.65
11,414,732.70		(IX) වැඩිහිටි නිවාස අළුත්වැඩියාව සඳහා ආධාර -	8,734,528.54
590,173.30		(X) පුහුණුවීම් හා ධාරිතා සංවර්ධනය	321,000.00
		(XI) ලෝක සෞඛ්‍ය සංවිධානය	1,401,166.48
		(XII) රු 1000 ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව	182,379,000.00
34,179,097.78		එකතුව	**211,713,759.87**

2011 රු.	සටහන් 7	ක්ෂය ප්‍රමාණය	12/31/2012 රු.
1,075,241.76		(I) ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	920,232.58
-		(II) ගොඩනැගිලි බෙදා වෙන්කිරීම	-
285,000.00		(III) වාහන	1,655,000.00
370,761,80		(IV) යන්ත්‍රෝපකරණ හා සවිකිරීම	216,002.40
1,731,003.56		එකතුව	**2,791,234.98**

2011 රු.	සටහන් 8	බැංකු ශිණුම්	12/31/2012 රු.
152,925.69		(I) බැංකු ශේෂය - ගි/අ - 228075	195,564.17
460,134.35		(II) බැංකු ශේෂය - ගි/අ - 5234881	321,451.04
130,455.72		(III) බැංකු ශේෂය - ගි/අ - 9179076	426,834.35
743,515.76		එකතුව	**943,849.56**

2011 රු.	සටහන් 9	උපචිත වියදම්	12/31/2012 රු.
234,423.00		(I) ගෙවිය යුතු ගමන් වියදම්	793,655.00
-		(II) ගෙවිය යුතු හැඳුනුම්පත් දීමනා	86,510.00
31,651.20		(III) ගෙවිය යුතු මුද්‍රණ වියදම්	-
15,036.25		(IV) ගෙවිය යුතු නිවාඩු දින වැටුප්	-
6,046.87		(V) ගෙවිය යුතු අතිකාල	-
68,000.00		(VI) ගෙවිය යුතු ජාතික සභා දීමනා	56,800.00
30,791.16		(VII) ගෙවිය යුතු තැපැල් හා දුරකථන ගාස්ත	45,227.77
16,174.89		(VIII) ගෙවිය යුතු ආරක්ෂක ගාස්තු	54,868.20
-		(IX) ගෙවිය යුතු පිරිසිදුකිරීමේ ගාස්තු	10,080.00
4,075.00		(X) ගෙවිය යුතු පුවත්පත් වියදම්	4,390.00
-		(XI) ගෙවිය යුතු අක්ෂි කාච හා වෛද්‍ය සායන වියදම්	2,793,900.00
42,456.50		(XII) ගෙවිය යුතු විදුලි හා ජල බිල්පත්	114,204.79
-		(XIII) ගෙවිය යුතු දිවා මධ්‍යස්ථාන ආධාර	549,389.00
81,288.50		(XIV) ගෙවිය යුතු වැඩිහිටි නිවාස ආධාර	-
3,750.00		(XV) ගෙවිය යුතු වෙනත් දීමනා වියදම්	-
82,850.00		(XVI) ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම්	50,731.85
-		(XVII) ගෙවිය යුතු සංග්‍රහ වියදම්	-
		(XVIII) ගොඩනැගිලි වෙන්කිරීම	1,413,015.00
		(XIX) ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම	3,555,000.00
-		(XX) ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල්	-
-		(XXI) ගෙවිය යුතු වාහන නඩත්තු කිරීම	-
616,543.37		එකතුව	**9,527,771.61**

2011 රු.	සටහන් 10	තොපියව අත්තිකාරම්	12/31/2012 රු.
1,000.00		(I) එස්. වයි. ගමගේ	1,000.00
1,000.00		එකතුව	**1,000.00**

විගණකාධිපතිගේ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2013 අගෝස්තු 22 දින නිකුත් කරන ලදී.

තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

ඩබ්. පී. සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

මගේ අංකය / எனது இல. / My No } එල්එස්/බී/එන්සීර්/එජ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 ඔක්තෝබර් 31 දින

සභාපති,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2013 අගෝස්තු 22 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය
ෆැක්ස් අංකය
ඉලෙක්ට්‍රොනික් තැපැල්

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්චිත ක්ෂය වෙන්කිරීම් රු. 435,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලද රු.104,614 ක් කෙටි කාලීන ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණු අතර, එය ස්කන්ධය (Equity /Liabilities) යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බැංකුවට බැර කරන ලද රු.41,245 ක් හා වැඩිහිටි ආවරණ කැපකරු ගිණුමට අදාලව බැංකුවට ලැබී තිබුණු රු.24,000 ක් හඳුනාගෙන ආදායමට ගෙන නොතිබුණි.

(ඈ) බැංකු ගාස්තු රු.4,550 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) උපචිත වියදම් රු. 382,150 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන්හි ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

	විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
(අ)	ස්ථාවර වත්කම්		
(i)	ලී බඩු හා උපකරණ	7,644,348	ස්ථාවර වත්කම් ලේඛනය
(ii)	යන්ත්‍ර හා උපකරණ	2,441,309	විස්තරාත්මක උපලේඛන
(ආ)	නිරවුල් නොකළ අත්තිකාරම්	1,000	අත්තිකාරම් ලේඛනය
(ඇ)	දුරකථන බිල්පත්	429,579	දුරකථන ගාස්තු ලේඛනය
(ඈ)	ගෙවීම්	404,700	බිල්පත්

(ඉ)	වැඩිහිටි කමිටු 84 ක් සඳහා රු.5,000 බැගින් මුදල් ලබාදීම	420,000	මුදල් ලබා ගත් බවට සනාථ කිරීම
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යවන ලද මුදල්	185,000	මුදල් ලබා ගත් බවට සනාථ කිරීම
(උ)	වැඩිහිටි නිවාස අලුත්වැඩියා	225,000 800,000	කාර්මික නිලධාරී වාර්තාව කුවිතාන්සි, ගිවිසුම් හා ප්‍රගති වාර්තා

2.2.3 නීති, රීති, මුදල් රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, මුදල් රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
		රු.	
(අ)	<u>මුදල් රෙගුලාසි</u>		
(i)	මු.රෙ. 371(2)(ඇ)	29,382	දෙන ලද අත්තිකාරම් එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත්, අවස්ථා 06 ක දී ලබාගත් අත්තිකාරම් ප්‍රමාද වී පියවා තිබුණි.
(ii)	මු.රෙ. 396	14,800	නිකුත් කර කල්ඉකුත්වූ චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.12,176,526 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,654,462 ක ඌනතාවයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,522,064 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන රු.9,744,471 කින් අඩුවීම, පුද්ගල පඩිනඩි රු. 6,696,701 කින් වැඩිවීම හා වෙනත් මෙහෙයුම් වියදම් රු.177,534,680 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2012 වර්ෂය තුළදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කිරීමට බලාපොරොත්තු වූ කාර්යයන් හා ඉටු කර ඇති කාර්යන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම.

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ග්‍රාමීය වැඩිහිටි කමිටු 570 ක් හා ප්‍රාදේශීය මට්ටමේ වැඩිහිටි කමිටු 20 ක් වශයෙන් කමිටු 590 ක් සඳහා රු.2,800,000 ක මූල්‍යාධාර සැපයීමට ඉලක්ක කර තිබුණ අතර, තථ්‍ය වශයෙන් ග්‍රාමීය මට්ටමෙන් කමිටු 09 ක් සඳහා රු. 67,500 ක් ද ප්‍රාදේශීය වශයෙන් වැඩිහිටි කමිටු 378 ක් සඳහා රු. 5000 බැගින් රු. 1,890,000 ද වශයෙන් එකතුව රු. 1,957,500 ක මූල්‍යාධාර ලබා දී තිබුණ බැවින් බලාපොරොත්තු වූ ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.

(ii) වැඩිහිටි කමිටු 110 ක් සඳහා රු.550,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණ ද එම කමිටු විසින් අවම ශේෂය ලෙස පවත්වාගත යුතු රු.3,500 ක් පවත්වාගෙන යන බවට සනාථ කර නොතිබුණි.

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.

(i) නිකුත් කිරීමට බලාපොරොත්තු වූ හැඳුනුම්පත් 50,000 ක් සඳහා රු. 920,000 ක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර, නිකුත් කර තිබුණු හැඳුනුම්පත් 17,119 ක් සඳහා රු.485,287 ක් වැයකර තිබුණි. ඒ අනුව සියයට 34 ක භෞතික ප්‍රගතියක් හා සියයට 53 ක මූල්‍ය ප්‍රගතියක් ලබාගෙන තිබුණි.

(ii) එක් ඡායාරූපයක් සඳහා රු.25 ක් බැගින් ගෙවීමට තීරණය කර තිබූ අතර ඊට පටහැනිව ඡායාරූප 2,122 ක් සඳහා රු.34,095 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(iii) නිකුත් කළ වැඩිහිටි හැඳුනුම්පත් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් තොරතුරු ලබාගෙන නොතිබුණි.

(ඇ) වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් යෙදවීම.

(i) සමාලෝචිත වර්ෂය තුළ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 36 ක් සඳහා රු.800,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණු අතර, දිවා මධ්‍යස්ථාන 16 කට රු.400,000 ක් වැයකර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන සැලසීමට ඇස්තමේන්තු දිවා මධ්‍යස්ථාන ප්‍රමාණයෙන් මධ්‍යස්ථාන 20 කට එසේ ප්‍රතිපාදන සැලැසීමට අපොහොසත්වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ දිවාමධ්‍යස්ථානවලට උපකරණ ලබාදීම සඳහා රු.25,000 ක් බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක පිහිටුවා තිබුණු දිවා මධ්‍යස්ථාන 16 සඳහා රු.400,000 ක් වැයකර තිබුණි. එම මුදල අදාළ කාර්යය සඳහා යෙදවූ බවට ලිඛිත තහවුරු කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මුද්‍රණ කටයුතු

සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණ කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සංශෝධිත පනතින් පිටපත් 5,000 ක් මුද්‍රණයට හා බෙදාහැරීමටත්, වැඩිහිටි සහරා 1,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු. 600,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම පනතේ පිටපත් මුද්‍රණය කර නොතිබුණු අතර, වැඩිහිටි සහරා 1,000 ක් මුද්‍රණය කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත නොවූ වැඩිහිටි හැඳුනුම්පත් 150,000 ක් හා වාර්ෂික වාර්තා 1,777 ක් මුද්‍රණය කර තිබුණි. ඉකුත් වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේද වැඩිහිටි සංශෝධිත පනතේ පිටපත් 5,000ක් මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණද. එම වර්ෂයේදි ද එම කාර්ය ඉටු කර නොතිබුණි.

(ඉ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

සමාලෝචිත වර්ෂය තුළ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 128 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද, වැඩසටහන් 08 ක් පමණක් පවත්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන්	පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් ගණන	පවත්වා තිබුණු වැඩසටහන් ගණන	අපේක්ෂිත ඉලක්ක ප්‍රතිශතයක් ලෙස ඉටුවූ වැඩසටහන් ගණන
			%
ප්‍රාදේශීය මට්ටමේ වැඩිහිටියන් දැනුවත් කිරීම	100	02	2

ගෘහස්ථ මට්ටමේ හෙද සේවයක් සැපයීමට ශ්‍රමිකයන් පුහුණු කිරීමේ පාඨමාලාවන් පැවැත්වීම.	04	01	25
උපදේශන වැඩසටහන්	20	04	20
විශ්‍රාම පූර්ව වැඩසටහන්	04	01	25
	------	-----	
	128	08	06
	=====	===	

(ඊ) විශ්‍රාම පූර්ව වැඩමුළුව පොලිස් දෙපාර්තමේන්තුවේ 225 දෙනෙකු වෙනුවෙන් පවත්වා තිබුණ ද සහභාගී වූ පිරිසට වඩා වැඩි පිරිසක් වෙනුවෙන් ආහාර සැපයීම හේතුවෙන් රු.49,014 ක් වැඩිපුර වියදම් කර තිබුණි. ඉහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීමට හේතුව ලෙස ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බව සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

(උ) අක්ෂි කාච මිලදී ගැනීම හා බෙදා හැරීම.

සමාලෝචිත වර්ෂය තුළ අක්ෂි කාච 1,800 ක් හා ශ්‍රවණ උපකරණ 60 ක් රෝගීන්ට ලබාදීමට සැලසුම් කර තිබුණ ද, වසර තුළ ආධාරලාභීන්ට කාච 1,064 ක් හා ශ්‍රවණ උපකරණ 26 ක් පමණක් නිකුත් කර තිබුණු බැවින් සැලසුම්ගත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි. ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවීම නිසා ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වූ බව සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

(ඌ) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය - 2012.

2012 ඔක්තෝම්බර් 01 දින ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය පවත්වා තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය සඳහා වියදම් ඇස්තමේන්තුව වගකිව යුතු නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණි.

(ii) උත්සවය සඳහා ඇස්තමේන්තු ගත මුදල වූ රු.2,673,211 ක් හා දැරූ වියදම වූ රු.791,448 ක් හා සැසඳීමේදී රු.1,881,763 ක අධි ඇස්තමේන්තුවක් සකසා තිබුණි.

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 50 ක වැඩිහිටි දිනය සැමරීම සඳහා වැය කළ රු. 791,448 ක් සම්බන්ධයෙන් තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණි.

(එ) වැඩිහිටි නිවාස අළුත්වැඩියා කටයුතු සඳහා අධාර ලබාදීම.

සමාලෝචිත වර්ෂය තුළදී වැඩිහිටි නිවාස 20 ක් අළුත්වැඩියාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇඹිලිපිටියේ වළල්ගොඩ සරණ සෙවන වැඩිහිටි නිවාසයේ ගිලන් කාමරය ඉදිකිරීම සඳහා රු.998,000 ක් සබරගමු පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ වෙත යවා තිබුණ ද, එම කාර්ය සම්බන්ධව කොන්ත්‍රාත් ගිවිසුම් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වැඩිහිටි නිවාස ඉදිකිරීම සම්බන්ධ හා අළුත්වැඩියා කටයුතු සඳහා ලබාදුන් රු.7,221,513 ක් මුදල් සම්බන්ධයෙන් අදාළ කාර්යන් නිම කළ බවට කාර්මික නිලධාරී විසින් සහතික කර වැඩ වාර්තාවක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එවා නොතිබුණි.

(ඒ) වැඩිහිටි දීමනා ගෙවීම.

වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට රු.1,000 ක මාසික දීමනාවක් 2012 ජූනි මස සිට ගෙවීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය විසින් රු.190,200,000 ක මුදලක් වැඩිහිටි ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. මෙම මුදල අදාළ අරමුණු කෙරෙහි යෙදවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අයදුම්පත් 4,183 ක් බැංකුව වෙත යවා නොතිබුණි.

(ii) 2012 ජූනි මස සංඛ්‍යා මත ගණනය කළ 2012 ජූලි සිට ඔක්තෝබර් දක්වා මාස 04 ක් සඳහා ප්‍රතිලාභීන් 182,379 කට වැඩිහිටි දීමනා රු.729,516,000 ක මුදලක් ගෙවීමට ප්‍රතිපාදන ලැබී නොතිබුණි.

(ඔ) 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තියේ ඇතුළත් පහත සඳහන් කාර්යයන් ඉටු කර නොතිබුණි.

(i) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම.

(ii) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම හා ක්‍රියාවේ යෙදවීම.

(iii) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාරී වීම.

(iv) මහජනතාවගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුළත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යාම.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මව්පිය සෙවන වැඩිහිටි නිවාසය ඉදිකිරීමේ කටයුතු කුකුලේගම උතුරු සමෘද්ධි බලකායට පවරා තිබූ අතර, ඒ සඳහා රු. 894,680 ක මුදලක් අනුමත කර තිබුණි. අදාළ ඉදිකිරීම සම්බන්ධයෙන් වූ බිල්පත හා අනුමත ප්‍රමාන බිල්පත්‍රය සැසඳීමේදී පහත වෙනස්කම් අනාවරණය විය.

(අ) අනුමත ප්‍රමාන බිල්පත්‍රයේ රු. 513,127 ක් වටිනාකම ඇති අයිතම් දෙකක් අත්හැරී තිබුණි.

(ආ) අයිතම් 6 ට අදාළව ඇස්තමේන්තුගත ප්‍රමාණ බිල්පත් සමඟ සැසඳීමේදී ඒකක 929.23 ක් ඉක්මවා තිබූ අතර, ඒ සඳහා රු. 528,166 ක මුදලක් වැඩිපුර වැය කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2010 නොවැම්බර් 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස්වීම් සටහනේ අංක 10 නියෝගය යටතේ 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළයුතු බව දක්වා තිබුණද, ජාතික සභාව විසින් එම කාලපරිච්ඡේදයට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික සභාවේ අභ්‍යන්තර විගණනය සමාජ සේවා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කර තිබුණි.

5.3 අයවැය පාලනය

අයවැය ලේඛනයේ ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 12 සිට සියයට 374 ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) අක්මිකාව නිකත් කිරීම

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති.

සමාජ සේවා අමාත්‍යාංශය
சமூக சேவைகள் அமைச்சு
Ministry of Social Services
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
National Secretariat for Elders

ඔබේ අංකය / மது இல / Your No:
මගේ අංකය / எனது இல / My No: NSE/7/Acc/GA/-2013
දිනය / திகதி / Date: 2013.09.06

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

විගණන විමසුම

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

උක්ත විගණන විමසුම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් පහත සඳහන් කරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). 2011 දෙසැම්බර් 31 දිනට ආයතනය සතුව ඇති වාහන පහත පරිදි වේ.

වාහන අංකය	ලැබුණු වර්ෂය	වටිනාකම (රු.)	ක්ෂය කළ යුතු වර්ෂ ගණන	ක්ෂය අනුපාතය	සමුච්චිත ක්ෂය (රු.)
KN-0515	2009	1,800,000/-	4	10%	720,000/-
18-356	2010	800,000/-	3	10%	240,000/-
QI-5819	2010	250,000/-	3	10%	75,000/-
KR-1128	2011	4,600,000/-	1	10%	460,000/-
NB-2688	2012	9,100,000/-	1	10%	910,000/-

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி ,தொகுதி D, செத்சிறிபாய - கட்டம் II, பத்தரமுல்லை
Address : 2nd Floor , Block D, Sethsiripaya - II Stage, Baththaramulla.
ඊමේල් / ஈ-மெயில்/ E-mail : nsemss@sltnet.lk
දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 3094544
කාර්යාලය / அலுவலகம் / Office : 3094543
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015

විගණනයේදී පෙන්වා දී ඇති වෙනසට හේතු වී ඇත්තේ QI-5819 හා KR-1128 වාහන සඳහා ක්ෂය කිරීම් සම්බන්ධයෙනි.

QI-5819 ක්ෂය ලේඛණයේ මෙම ත්‍රී රෝද රථය 2010 වර්ෂයේ මිලදී ගත් බව සඳහන් වේ. මෙම ත්‍රී රෝද රථය සම්බන්ධව ලියාපදිංචි ලේඛන පරීක්ෂා කිරීමේදී පහත සඳහන් තොරතුරු හඳුනා ගැනීමට හැකි විය.

මෙම වාහනයේ මුල් ලියාපදිංචි දිනය 2007.01.08 දිනයි. එවකට මෙම වාහනය Help age Sri Lanka නමින් තිබී ඇත.

අප ආයතනයට මෙම වාහනය මාරුකර ඇත්තේ 2011.05.19 දිනයි. මේ අනුව වාහනයේ ක්ෂය වීම් සිදු කිරීම 2007-2012 දක්වා වර්ෂ 06 ක් සඳහා ක්ෂය කල යුතුව ඇත. මෙම සියළු තොරතුරු නිවැරදි කර 2013 අවසන් ගිණුම් සකස් කිරීමේ දි පෙර වර්ෂ ගැලපුම් ගිණුම හරහා නිවැරදි කිරීම් වලට සටහන් කර ගන්නා ලදී.

KR-1128 මෙම වාහනය ලියාපදිංචි දිනය 2011.11.18 දිනය. මිලදී ගත් වර්ෂය 2011 වුවද මසක පමණ කාලයක් පමණක් හා මිලදී ගත් වර්ෂයේ ක්ෂය කිරීම් කර නැත.

තවද මෙම වාහනය මිලදී ගත් දිනය 2011 වුවද මෙහි ධාවනය ආරම්භ කර ඇත්තේ 2012 වර්ෂයේදී බැවින් 2011 වසරට ක්ෂය කිරීම් ප්‍රායෝගික නොවන බව පෙනේ. ඒ අනුව මෙම වාහනය සඳහා ක්ෂය කර ඇති ප්‍රමාණයන් නිවැරදි බව දන්වා සිටිමි.

මේ අනුව ශුද්ධ වත්කම් වල වැඩියෙන් සටහන් වූ මුදල රු. 435,000/- ලැබී ඇත්තේ K.R 1128 වාහනයේ රු. 460,000/- කි. 2011 වාහන ක්ෂය ලෙස ලබා නොගැනීම හා QI-5819 වාහනය වැඩිපුර වසරක් ක්ෂය කිරීම හේතුවෙනි. **KR-1128** වාහනය 2011 නොවැම්බර් 30 දින ලියාපදිංචි කර ඇති අතර ධාවනයට යොදවා ඇත්තේ 2012 වසරේ දි බැවින් 2011 වසරට මෙම වාහනය ක්ෂය කල යුතු නැති බව පෙන්වා දෙමි. QI-5819 වාහනය මිලදී ගැනීම 2007 වසරේ බැවින් තවදුරටත් ක්ෂය කල බැවින් මෙම ගැලපීම් 2013 අවසන් ගිණුම් සකස් කිරීමේදී ගැලපීම් කිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ). <u>ගිණුම ඉදිරිපත් කිරීම</u>

i. වැඩිහිටියන් සඳහා ආධාර කිරීම සඳහා ආවරණ කැපකරු ගිණුම නමින් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම ගිණුම 2012 වර්ෂයේ පහත පරිදි ගණුදෙණු සිදු වී ඇත.

2011.12.31 අවසාන ගිණුමේ ශේෂය	- 393,337.76
2011.12.31 ට වර්ෂය තුල ලැබීම්	- 195,900.00
2011.12.31 ට වර්ෂය තුල ගෙවීම්	- 229,200.00
2011.12.31 ට ශේෂය	- 360,037.76

ii. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉතිරි වී ඇති මුදල රු. 104,614/- ජංගම බැරකමකි. අවසන් ගිණුමේ බැරකම් සියල්ල (ජංගම වත්කම් හා වගකීම් ලෙස) එකට දක්වා ඇත. ඉදිරියේදී මෙම තොරතුරු වෙන්කිරීම් සිදුකරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

(ඈ). ගිණුම පිළියෙල කිරීමේදී වාහන සම්බන්ධව නිවැරදි ශේෂයන් හා වර්ෂය තුළ මිලදී ගැනීම් නිවැරදිව සටහන් කර ඇත. එහෙත්, 2012 වර්ෂයේ ප්‍රධාන වශයෙන් ලද රු. 9,100,000/- වන වාහනය සටහන් කිරීමට අතපසු වී ඇත. ලෙජර් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කර ඇත. මෙවැනි අඩුපාඩු මින් ඉදිරියට නොවීමට කටයුතු කර ඇත.

(ඇ). <u>බැංකු ගිණුම්</u>

i. 2012 වර්ෂයේ බැංකුවෙන් ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් වල අපගේ මුදල් පොතේ සටහන් නොවූ බැරකිරීම් නිරීක්ෂණය විය. මෙම මුදල් මොනවාදැයි බැංකුවෙන් විමසා කටයුතු කළ යුතුවේ. ලංකා බැංකුවෙන් මේ සම්බන්ධයෙන් විමසීම් කර ඇතත් මෙම මුදල් තැන්පත් කළ තොරතුරු හරිහැටි අනාවරණය කිරීමෙන් පසුව ආදායමට ලබාගනු ලැබේ.

ii. සෑම වර්ෂයකම බැංකු ගාස්තු වසරක් ගෙවීමෙන් පසු ගිණුම් ගතකිරීම සිදුකර ඇත. එහෙත්, 2013 වසරේ මෙම බැංකු ගාස්තු මාසිකව ගිණුම්ගත කර ඇත. 2013 ජූලි මාසයේ බැංකු ගාස්තුවද ගිණුම් ගතකර ඇති අතර, මෙම අඩුපාඩුව නැවත සිදුනොවීමට කටයුතු සලසා ඇත.

iii. වැඩිහිටි ආවරණ කැපකරු ක්‍රමයට අදාල ගිණුම් අංකයට පරිත්‍යාගශීලීන්ගෙන් මුදල් ඉල්ලා සෘජුව බැංකුවට බැරකිරීමට ප්‍රචාරණ කටයුතු කර ඇති බැවින් පරිත්‍යාගශීලීන් සෘජුවම බැරකිරීම් කරනු ලැබේ. මෙය හඳුනාගත් පසුව පමණක් රිසිට්පත් නිකුත් කර ගිණුම්ගත කරනු ලැබේ. එබැවින්, මෙම මුදල 2013 ජනවාරි මස හඳුනාගෙන ගිණුම්ගත කර ඇත. ශාන්ති හිත්ටඩි යන මහත්මිය විසින් මෙම මුදල බැංකුගත කර ඇත.

(ඉ). 2012 ඔක්තෝබර් 1563 වවුචරය මගින් විදුලිය සඳහා විදුලි පෞද්ගලික සමාගම වෙත ගෙවීම පිණිස සකස් කර ඇති චෙක්පතකි. චෙක්පත නිකුත් කර ඇති අවස්ථාව වන විට විදුලිය විසන්ධි වී ඇති බැවින්, හිමිකරු විසින් මුදල් ගෙවා මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කර ඇත. මුදල් ගෙවීමේදී ඔහු විසින් විසන්ධි කිරීමේ ගාස්තු ද ඇතුලත්ව රු. 50,750/- ක් ගෙවා ඇත. අප විසින් ලියන ලද රු. 49,721/- චෙක්පත අවලංගු කර රිසිට්පතක් නිකුත් කර ඇත. ලෙජර් ගිණුමෙන් ගෙවීම් කපා හැර නැත. වර්ෂයේ මුළු විදුලි වියදම රු. 858,868.50 ගණනය කර ඇත්තේ මෙම මුදල ද ඇතුලත්වයි. එබැවින්, නිවැරදිව ගිණුම් ගතවී ඇත.

(ඊ). ප්‍රමාද දෝශයකින් රු. 2,702/- ක් වූ කතරගම වැඩිහිටි නිවාසයේ විදුලි බිල කාර්යාල විදුලි බිලක් ලෙස සටහන්ව ඇත. මෙවැනි අඩුපාඩු මින් ඉදිරියට නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

(උ). උපචිත වියදම් ලෙස ගෙවා ඇති මුදල් ගෙවීම සඳහා වූ වවුචර් ඉදිරිපත් වී ඇත්තේ පසු වර්ෂයේ දී බව පූර්ව හඳුනාගැනීමක් සිදු කර නොමැති අතර අතිකාලය, නිවාඩු දින වැටුප්, ගමන් වියදම දෙසැම්බර් මස වියදම් බැවින් උපචිත වියදම් සේ ලබා ගත නොමැත. සෑම වසරකම මෙම වියදම් ක්‍රමානුකූලව සිදු වන බැවින් මෙම වියදම් වල සමස්ත ප්‍රතිඵලයේ හි වෙනසක් සිදු නොවේ. මෙවැනි අඩුපාඩු මින් ඉදිරියට නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

(ඌ). 2012 වර්ෂයේ ගිණුම් වලට ජ`නල් සටහන් ගණකාධිකාරී විසින්ම යොදා ඇති සටහන් වේ. අත්සන් කිරීම් කර නොමැති අතර විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව එහි අත්සනක් යොදා ඇත. ජ`නල් 21 හා 29 ට අදාළ සටහන් ජ`නලයේ සටහන් කිරීමට අතපසු වී ඇත. මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන ලද අතර මින් ඉදිරියට මෙවැනි වරදක් සිදු නොවීමට කටයුතු කරමි.

(එ). 2012 වර්ෂයේ දී අවශ්‍ය අක්මුදල් නිසි පරිදි නොලැබීම හේතුවෙන් අත්‍යවශ්‍ය ගෙවීම් පවා ප්‍රමාද වීම් සිදු විය. විදුලිය බිලද අක්මුදල් නිසි පරිදි භාණ්ඩාගාරයෙන් නොලැබීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූවකි. එබැවින් දඩ මුදලක් ගෙවීමට සිදු වූ බව දන්වා සිටිමි.

(ඒ). සරප් වෙත මුද්දර ලේඛණයක් නිසි පරිදි පවත්වාගෙන යාමට උපදෙස් දී ඇති අතර 2013 වසරේ මුද්දර ලේඛණය පවත්වා ගෙන යනු ලැබේ.

(ඔ). <u>වැරදි ලෙස ලේජරයේ සටහන් කිරීම</u>

i. 2012 වර්ෂය දක්වා බැංකු ගාස්තු ලෙස වෙනම වැය විෂයක් හඳුන්වා දී නොමැති අතර වසර ගණනාවක සිට තැපැල් හා විදුලිය වැය විෂයට හර කර ඇත.2013 වසරේ සිට බැංකු ගාස්තු වෙනම වැය විෂයකට හර කිරීම කර ඇත.

ii. වැරදීමකින් ගිණුම් ගත වී ඇත. මෙවැනි අඩුපාඩු ඉදිරියේ දී සිදු නොවීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

iii. වැරදීමකින් ගිණුම් ගත වී ඇත. මෙවැනි අඩුපාඩු ඉදිරියේ දී සිදු නොවීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

2.3.2 <u>නොසැසඳුණු පාලන ගිණුම්</u>

(අ). 2011 වසරේ අවසාන ගිණුමේ ඉදිරියට ගෙනෙන ලද ශේෂය රු. 50,800/- සාවද්‍ය බව හඳුනාගෙන පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම හර කර උත්සව අත්තිකාරම් ගිණුම රු. 8,800/- ක් බැර කිරීමට ජ`නල් සටහන් අංක 31 යොදා ගෙන ඇත. 2012 වර්ෂයේ ගෙවීම් හා ලැබීම් සටහන් කිරීම අනුව පහත පරිදි වේ.

උත්සව අත්තිකාරම් ගිණුම

ශේෂය ඉ/ගෙ	50,800	පෙර වර්ෂ ගැලපුම් ගිණුම	8,800
2012 වසරේ ගෙවීම්	195,000	2012 වසරේ අය කිරීම්	174,500
		ශේෂය ප/ගෙ	62,500
	245,800		**245,800**

එහෙත් මෙම ගිණුමේ ශේෂය රු. 62,500/-ට අදාල කේවල ලැයිස්තුව රු. 61,500/- ක් ලෙස සඳහන් වේ.(ඇමුණුම 1) 2011/12/31 දිනට ආරම්භක ශේෂයේ සත්‍ය වටිනාකම රු.4[illegible]/- ක් විය යුතු බැවින් පෙර වර්ෂ ගැලපුම් ගිණුමට රු 8,800/- නොව රු. 9,800/- හර කල යුතුව ඇත. මෙම වරද 2013 වසර අවසන් ගිණුම සකස් කිරීමේ දි සිදු කිරිමට සටහන් කර ගෙන ඇත.

(ආ). 2012 ජනවාරි 01 වන දින ගංවතුර අත්තිකාරම් ගිණුම් ශේෂය රු. 130,390.96 ක් වන අතර, 2012.12.31 වන දිනට ශේෂය රු. 32,597.48 කි. මෙය 2012.12.31 දිනට ශේෂ පත්‍රයේ මෙම මුදල ජංගම වත්කම් යටතේ සටහන් කර ඇත.
වර්ෂය තුළ අයකළ මුදල - 97,793.48
ඒ අනුව, අවසන් ශේෂය ද නිවැරදි.

(ඇ). පෙර වර්ෂ ගණනාවක සිට අත්තිකාරම් සඳහා වෙනමම ලෙජරයක් පවත්වාගෙන යනු ඇත. ප්‍රධාන ලෙජරයේ මෙවැනි ගිණුමක් තබාගෙන ගොස් නැත. එහෙත්, විගණනයෙන් පෙන්වාදීමෙන් අනතුරුව මේ සඳහා වෙනමම ලෙජර් පිටුවක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

(ඈ). වැරදීමකින් සටහන් කර ඇති අතර අවසන් ගිණුමේ 2012.12.31 දිනට ශේෂය නිවැරදි කර බැංකු සැසඳුමේ නිවැරදි කර සටහන් ඇත. මෙවැනි අඩුපාඩු ඉදිරියේ දි සිදු නොවීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

(ඉ). ලෙජරයේ 412, 413 පිටුවල සටහන් කර ඇත්තේ ගංවතුර වාරික ලැබීම් සටහන් කිරීමකි. ඉහත (අ) සටහනේ ලියා ඇති පරිදි පිළිතුරෙන්ද මේ බව සනාථ වේ.
ආපදා ණය සඳහා පොදු ලෙජරයේ පිටුවක් මේ දක්වා තබාගෙන ගොස් නැත. මෙම තොරතුරු සීසී10 ලේඛනයේ සටහන් කර ඇත. විගණනයෙන් පෙන්වා දුන් පරිදි පොදු ලෙජරයේ ආපදා ණය සඳහා පිටුවක් යොදා අදාල ගෙවීම්, ලැබීම් සටහන් කිරිමට කටයුතු කර ඇත.
ආපදා ණය ගිණුමේ ශේෂය කේවල ශේෂ ලැයිස්තුවට සමාන වේ.

(ඊ). ලෙජරයේ ශේෂය එකතු කිරීමේදි ප්‍රමාද දෝශයකින් රු. 55,315 ලෙස සටහන් වුවද, නිවැරදි ශේෂය රු. 59,705 කි. මෙම අගය නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(උ). 2012.12.31 දිනට උපචිත වියදම් ලෙස 2012 වර්ෂයේ දෙසැම්බර් මස අතිකාල වියදම් ගිණුම් ගත කර නොමැත. එහෙත් ලෙජරයේ මුළු වටිනාකම රු. 434,119.87 ලෙස නිවැරදි කර ඇත.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ). i. ලී බඩු හා උපකරණ - 7,644,348/-

මෙම ස්ථාවර වත්කම් වැඩිහිටි ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තිබෙන මිල ප්‍රමාණයේ වටිනාකම් වේ. මේවා වෙන් වශයෙන් හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල උපකරණ සඳහා නිකුත් කිරීම් නියෝග නිකුත් කර ලැබීම් නියෝග ලබා ගත නිසි පරිදි කටයුතු කර ලේඛණය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

i. යන්ත්‍ර හා උපකරණ - 2,441,309/-

ඉහත (i)හි පරිදි කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ප්‍රවර්තන වර්ෂයේ සිට කටයුතු කරනු ඇත.

(ආ). නිරවුල් නොකල අත්තිකාරම් - 1000/-

මේ සම්බන්ධව සොයා බැලූ අතර මෙය 2011 වර්ෂයේ ගිණුම් තැබීමේ දී ප්‍රමාද දෝෂයක් නිසා සිදු වී ඇත. මෙම නිවැරදි කිරීම 2013 අගෝස්තු මස සිදු කරන ලදි.

(ඇ). දුරකථන බිල්පත් - 429,579/-

එක් එක් දුරකථනය වෙනුවෙන් වෙනමම ලේඛණයක් පවත්වා ගෙන යාමටත්, දුරකථන බිල් උපරිම සීමාවන් අනුව ගෙවීම් කිරීමට හා නිලධාරීන්ගේ දුරකථන වල සීමාව ඉක්මවූ දුරකථන වැටුපෙන් අය කිරීම සඳහා දුරකථන බිල්පත් ලේඛණයක් සකස් කිරීමට 2013 වසරේ සිට කටයුතු කර ඇත.

(ඈ). ගෙවීම් - 404,700/-

(සොයා බලා තොරතුරු ඉදිරිපත් කළ පසුව පිළිතුරු සකස් කර දෙනු ලැබේ.)

(ඉ). වැඩිහිටි කමිටු 84 ක් සඳහා රු. 5,000/- බැගින් මුදල් ගෙවීම ග්‍රාම නිලධාරී වසමකට එකක් බැගින් වැඩිහිටි කමිටු පිහිටුවා ප්‍රාදේශීය ලේකම් වෙත රු. 5000/-ක මුදලක් නිදහස් කර ප්‍රාදේශීය ලේකම් වෙත මෙම මුදල ලබාදෙනු ලැබේ. මේ සඳහා විෂය නිලධාරී වෙත ගොනුව මගින් සිහි කැඳවීම් යවා මෙම තොරතුරු ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඊ). ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට යවන ලද මුදල් සම්බන්ධයෙන් සිහි කැඳවීම් මගින් අදාල කුවිතාන්සිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඊ). අත්තිකාරම් ලබාදීම - 119,500/-
අනුමත ඇස්තමේන්තු ලබාදීමෙන් තොරව අත්තිකාරම් මුදල් නිදහස් කිරීම කරනු නොලැබේ.

(උ). වැඩිහිටි නිවාස අලුත්වැඩියාව - රු. 225,000/-
- රු. 800,000/-
(සොයා බලා තොරතුරු ඉදිරිපත් කළ පසුව පිළිතුරු සකස් කර දෙනු ලැබේ.)

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

(i) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 3.7 වගන්තිය - රු. 150,000/-
ණය මුදල් ඉල්ලීම් කිරීමේදී ඉල්ලුම්පත්‍ර ලද වහාම ඒ සඳහා වවුචර් පිළියෙල කර උත්සව අත්තිකාරම් ලේඛනයේ සටහන් කළ ද මුදල් ගෙවීම් කරනුයේ ඉන් පසුවයි. මෙම උත්සව අත්තිකාරම් ගෙවූ දිනය හා අය කළ මාසය පහත සඳහන් පරිදි වන අතර, ඒ අනුව නිසි පරිදි (ආ.සංග්‍රහය XXIV 3.7 වගන්තිය අනුව) අයකිරීම් කර ඇති බැවින් මෙහිදී වරදක් සිදුවී නැති බව දන්වා සිටිමි.

නම	උත්සව අත්තිකාරම් ලේඛනයේ සටහන් කළ දිනය	මුදල් ගෙවා ඇති දිනය	වැටුපෙන් අය කළ මාසය
යූ. ජී. එස්. කුමාර	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ආර්. සී. ජී. එස්. රංකොත්	2012 මාර්තු	2012 අප්‍රේල්	2012 මැයි
ඩබ්. එම්. ටී. බණ්ඩාර	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
පී. එල්. කේ. පීරිස්	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ඩී. එම්. එස්. දිසානායක	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ඒ. එස්. වික්‍රමාරච්චි	2012 අප්‍රේල්	2012 මැයි	2012 ජූනි
ජේ. බී. ඒ. ශ්‍රියානි කාන්ති	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
චම්පිකා නයනකුමාරි	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
කේ. ජී. නිශාන්ත	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ආර්. පී. වීරවර්ධන	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
පී. කේ. එස්. සේනාරත්න	2012 ජූනි	2012 ජූලි	2012 අගෝස්තු
ඒ. ආර්. කේ. කාන්ති අතපත්තු	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ඩී. එම්. පී. පී. කේ. විජේරත්න	2012 මාර්තු	2012 අප්‍රේල්	2012 මැයි
ඩබ්. එම්. වත්සලා	2012 මාර්තු	2012 අප්‍රේල්	2012 මැයි
එච්. කේ. එස්. ජයරුක්	2012 මැයි	2012 ජූලි	2012 අගෝස්තු

එන්. සාගරිකා	2012 මාර්තු	2012 අප්‍රේල්	2012 මැයි
ටී. ජී. වසන්ති	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ආර්. එච්. විජේසේන	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
කේ. එම්. සී. කුමාරි	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
එන්. ඩබ්. ඩී. විපුලකුමාරි	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ඩබ්. ජී. පී. කුමාර	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ආර්. කේ. ශ්‍රියානි	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
නිහාල් ජයන්ත	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
ආර්. එම්. සිරිවර්ධන	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
අයි. ඩී. මුණසිංහ	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
යූ. සාම්‍යා	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
එම්. පී. වික්‍රමාරච්චි	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
එල්. ඒ. රුවන්පතිරණ	2012 මාර්තු	2012 මැයි	2012 ජූනි
පී. ඒ. පී. අයි. විජේකුලසූරිය	2012 මාර්තු	2012 අප්‍රේල්	2012 මැයි
අනිල් මංගල	2012 මාර්තු	2012 අප්‍රේල්	2012මැයි

(ii) <u>මුදල් රෙගුලසි</u>

මු.රෙ 225(1) - රු. 638,862/-

ලිපි ගොනු සම්බන්ධතාවය කිසි පරිදි පවත්වා ගෙන යාමට විෂය නිලධාරීන් දැනුවත් කරන ලදි. මින් ඉදිරියට වව්චර් සකස් කිරීමේදි සැලකිලිමත් වන ලෙස උපදෙස් ලබාදී ඇත.

මු.රෙ 371(2)(ඇ)- රු. 105,000/-

(සොයා බලා තොරතුරු ඉදිරිපත් කළ පසුව පිළිතුරු සකස් කර දෙනු ලැබේ.)

මු.රෙ 396 - රු 60,846/- මාස 06 ක් ඉක්මවූ චෙක්පත් සම්බන්ධව කටයුතු නොකිරීම

මාස 06 ක් ඉක්මවූ සියලුම චෙක්පත්ලාභීන්ට මේ සඳහා ලිපි යවා චෙක්පත් දීර්ඝ කිරීම සිදුකර ඇති අතර, දේශීය ආදායම් කොමසාරිස් වෙත නිකුත් කර ඇති චෙක්පත් සම්බන්ධයෙන් ලිපි ගනුදෙනු සිදුකරමින් පවතී. අවසන් නිවේදනය නිකුත් කිරීමෙන් අනතුරුව මෙම චෙක්පත් රජයේ ආදායමට ගෙන චෙක්පත් නිරවුල් කර ඇති අතර, ඉතිරි චෙක්පත් සම්බන්ධව 2013 සැප්තැම්බර් මාසය තුළ කටයුතු කරනු ඇත.

(iii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - රු. 163,500/-

අමාත්‍යාංශ ලේකම්ගේ අභ්‍යන්තර මුදල් බලතල බෙදීම යටතේ රු. 250,000 දක්වා වූ මුදලකට බලය දීමේ ආසන්නතම නිලධාරියා ලෙසට ජා.වැ.ම.ලේ.කා හි අධ්‍යක්ෂවරයා ක්‍රියා කරනු ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත. ඒ අනුව රු. 163,500 ක මුදල උක්ත දැක්වූ මුදල් බලතල බෙදීම යටතට පත් වී ඇත.

3.1 මූල්‍ය ප්‍රතිඵලය

2012 වර්ෂයේ මූල්‍ය ඌණතාවය රු. 12,176,526 ක් වේ. මූල්‍ය ප්‍රතිඵලය පසුගිය වසරට වඩා ඌණතාවය වැඩිවීමට හේතු වී ඇති කරුණු පාලනය කළ නොහැකි පහත කරුණු වේ.

1. රජයේ ප්‍රධාන තොලැබීම - රු. 9,744,471/-
2. පුද්ගල පඩිනඩි වැඩිවීම - රු. 6,696,701/-
3. මෙහෙයුම් වියදම් වැඩිවීම - රු. 177,534,680/-

පුරෝකතනය කරන ලද රජයේ ප්‍රධාන නිසි පරිදි තොලැබීම පාලනය කළ නොහැකි විය. 2012 වර්ෂයේ නවක නිලධාරීන් 08 දෙනෙකු සේවයට බඳවාගෙන ඇති අතර, ඒ සඳහා වැටුප් ගෙවීමට ගිය වියදම් හේතුවත් හා අන්තර් දීමනා (චක්‍රලේඛන ප්‍රකාරව) ගෙවීමට සිදුවීම හේතුවෙන් පෞද්ගලික වැටුප් වැඩිවී ඇත. වැඩිහිටියන් සඳහා රු. 1000/- දීමනාව ගෙවීම මෙහෙයුම් වියදම් වැඩිවීමට හේතු වී ඇත. කෙසේ වෙතත් මේ කිසිදු වියදමක් පාලනය කළ නොහැකි වියදම් බව සඳහන් කරමි. වියදම් අවම කිරීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ඇත.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

උපචිත වියදම් වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ 2012 දෙසැම්බර් මස ප්‍රමාණවත් අක්මුදල් තොලැබීම හේතුවෙනි. එබැවින්, 2012 වර්ෂයට අදාල රු. මිලියන 9 කට අධික වවුචර් සඳහා ගෙවීම් කිරීමට සිදුවූයේ 2013 වර්ෂයේදී වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

i. ගම් මට්ටමින් වැඩිහිටි කමිටු පිහිටුවීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 570 ක් ඉටුකළ යුතු වුවත්, ඉටුකර ඇත්තේ 378 කි. එය ප්‍රගති වාර්තාවේ 516 ලෙස මුද්‍රණය වී ඇත්තේ මුද්‍රණ දෝශයකිනි.

ii. හැඳුනුම්පත් නිකුත් කිරීම

ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.50,000 ක් නිකුත් කළ යුතුව ඇත. ප්‍රගති වාර්තාවේ එය රු.20,500 ක් ලෙස දක්වා ඇත්තේ ඉදිරිපත් කර තිබූ සියලුම වව්චර් පත් අනුවය. නමුත්, මුදල් ගෙවීමේදී වවුචර් පත් වලින් ප්‍රමාණයක් දෝශ සහිත බැවින් ඉවත් කොට ඇත. ඒ අනුව, සමස්ත ගණන රු.17,119 කි.

iii. දිවා සුරැකුම් මධ්‍යස්ථාන

2012 වර්ෂය තුළ දිවා මධ්‍යස්ථාන 17 ක් සඳහා මූල්‍යාධාර ලබාදී ඇත. එහි අපේක්ෂිත ඉලක්කය 36 ක් වූ නමුත්, ලැබුණු ප්‍රතිපාදන මදිකම නිසා ඉලක්ක සපුරා ගත නොහැකි විය.

iv. මුද්‍රණ කටයුතු

සංශෝධිත පනත

5000 ක් මුද්‍රණය කිරීමට අපේක්ෂා කර තිබුන ද අවශ්‍යතාවයක් පැන නොනැගීම තුළ මුද්‍රණය නොකිරීම.

වාර්ෂික වාර්තා

කාර්යාලීය අවශ්‍යතා මත මුද්‍රණය කරන ලදී.

වැඩිහිටි හැඳුනුම්පත්

නිශ්චිත වශයෙන් ගණනය කර නොතිබූ නමුත්, සේවා අවශ්‍යතාවය මත මුද්‍රණය කිරීමට සිදුවිය.

v. වෛද්‍ය සායන, අක්ෂි කාච සහ ආධාරක උපකරණ නිකුත් කිරීම

ඉලක්ක ගත ප්‍රමාණයට ළඟාවීමට නොහැකි වූයේ මූල්‍ය ප්‍රතිපාදන නොතිබූ බැවින් වන අතර, වර්ෂ අවසානය වන විට රු. මිලියන 5.212 ක් වියදම් කර තිබුණි. නමුත්, ගෙවිය යුතු මුදල් ප්‍රමාණයක් ද ඉතිරිව තිබුණි.

vi. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම

සමස්ත වියදම 1.013 ක් වේ. එය නිවැරදි නමුත් හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා ආයතනය විසින් දරන ලද වියදම් ලිපි ගොනුවට ඇතුළත් නොවීම මත 0.791 ක් ලෙස සඳහන් වේ.

පාලක සහා රැස්වීම්

වාර්ෂික ප්‍රගති වාර්තාවේ මූල්‍ය ප්‍රගතිය 0.733 ක් ලෙස සටහන් වූයේ මුද්‍රණ දෝශයකිනි.

(අ) වැඩිහිටි කමිටු සඳහා මූල්‍යාධාර ලබාදීම

I. 2012 වර්ෂය තුළ ග්‍රාමීය කමිටු වැඩිහිටි කමිටු 378 ක් සඳහා රු. 5,000/- බැගින් හා ප්‍රාදේශිය වැඩිහිටි බල මණ්ඩල 09 ක් සඳහා රු. 7,500/- බැගින් ද මුදල් ආධාර ලබා දෙන ලදී. ලිපි ගොනු අනුව ද ඉහත තොරතුරු නිවැරදි වේ.

II. රු. 5,000/- ආධාර මුදල් ලබා දෙන ලද ග්‍රාමීය වැඩිහිටි කමිටු නමින් පවත්වා ගෙන යන ගිණුම් වල රු. 3,500/- මුදල් ශේෂයක් තිබිය යුතු බව සනාථ කෙරෙන තොරතුරු ලබා ගැනිම සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇති අතර මෙතෙක් තොරතුරු නොලැබ් ඇති කමිටු වලින් ද ඉදිරියේ දි ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරිම

i. 2012 වර්ෂය අවසාන වන විට ප්‍රගති වාර්තාවල වැඩිහිටි හැඳුනුම්පත් 20500ක් ලබා දෙන බව සඳහන් කිරිමට හේතු වූයේ 2012 වර්ෂය අවසානයේ මුදල් ගෙවීම සඳහා නියමිතව තිබූ සියලුම වවුචර් ගිණුම් අංශය වෙත යොමු කර තිබුනු බැවිනි. එහෙත් සමහර වවුචර්පත් වල අඩුපාඩු තිබීම හෙතුවෙන් අදාල වර්ෂයේ මුදල් ලබා දෙන ලද මුළු වැඩිහිටි හැඳුනුම්පත් ප්‍රමාණය 17109ක් විය.

ii. වැඩිහිටි හැඳුනුම්පත් ලබා දිමේ දි මුද්දර ප්‍රමාණයේ ජායාරූප 2ක් සඳහා රු. 25ක මුදලක් ගෙවනු ලැබේ. එහෙත් දිවයින පුරා රු. 25 යටතේ ජායාරූප ගත්තා ජායාරූප ශිල්පීන් ඇත්තේ ඉතාමත් සීමිත ප්‍රමාණයකි. එසේම එක්දින සේවා වලදී අදාළ ජායාරූප එදිනම මුද්‍රණය කර දිමේ ජංගම සේවා වලදී රු. 40ක මුදලක් ගෙවනු ලැබේ.

iii. වැඩිහිටි හැඳුනුම්පත් සඳහා මුදල් ගෙවිමේ දි අදාල නියමිත තොරතුරු ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් ලබා දුන් පසුව පමණක් අදාළ ගෙවීම් කරන අතර ජායාරූප ලබාදුන් පසුව එම නිලධාරින් අදාල වවුචර් මෙම කාර්යාලය වෙත යොමු කරයි.

ඉදිරියේ දි ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් මෙතෙක් නිකුත් කර ඇති වැඩිහිටි හැඳුනුම්පත් තොරතුරු ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ඇ) <u>වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා මුදල් යෙදවීම</u>

i. දිවා මධ්‍යස්ථාන 16 ක් සඳහා මුදල් ලබා දුන් අතර, ඉල්ලුම්පත්‍ර එවා තිබූ ඉතිරි දිවා මධ්‍යස්ථාන 10 යේ ලිපි ලේඛන වල අඩුපාඩු පැවතුණි. එබැවින්, එම දිවා මධ්‍යස්ථාන 10 සඳහා පසුව මුදල් ලබාදීමට බලාපොරොත්තු වේ.

ii. ලිඛිත තහවුරු කිරීම් සඳහා ලිපි තවමත් ලැබෙමින් පවතී. සිහි කැඳවීම් ලිපි ද යවා ඇත.

(ඈ) <u>මුද්‍රණ කටයුතු</u>

සමාලෝචිත වර්ෂයේදී සංශෝධිත පනතින් පිටපත් 5000 ක් මුද්‍රනය කිරීමට සැලසුම් කර තිබුන ද, අවශ්‍යතාවය පැන නොනැගීම තුළ අදාල මුද්‍රණ කටයුතු සිදු නොකරන ලදී. නමුත්, සේවා අවශ්‍යතාවයක් පැන නැගීම තුළ වාර්ෂික වාර්තා පිටපත් 1777 ක් හා වැඩිහිටි හැඳුනුම්පත් 150000 ක් මුද්‍රණය කිරීමට සිදු විය.

(ඉ) <u>දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>

i. ප්‍රාදේශිය මට්ටමින් වැඩිහිටි දැනුවත් කිරීමේ වැඩසටහන් 100 පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවීම නිසා ඉලක්ක කරා ලගා වීමට නොහැකි විය.

ii. වැඩිහිටි සත්කාරක සේවාලාභීන් පුහුණු කිරීමේ වැඩසටහන් 4 ක් පැවැත්වීම සඳහා 2012 වර්ෂයේ සැලසුම් කර තිබුණ නමුත් මුදල් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම වර්ෂයේ දි කිරීමට හැකි වුයේ එක් වැඩ සටහනක් පමණි.

iii. උපදේශන වැඩසටහන් 20 ක් සැලසුම් කර තිබුණ ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවීම නිසා ඉලක්ක කරා ලගා වීමට නොහැකි විය.

iv. 2012 සමාලෝචිත වර්ෂය තුල විශ්‍රාම පූර්ව වැඩසටහන් 4 ක් පැවැත්වීම සඳහා සැලසුම් කර තිබුණ ද ප්‍රතිපාදන නොමැති වීම නිසා එක් වැඩසටහනක් පමණක් පවත්වන ලදී.
අදාල වැඩසටහන සඳහා නිලධාරීන් 225 ක් සහභාගී වීමට නියමිතව තිබූ බැවින් එම වැඩසටහන පැවති 2012/12/18 හා 19 යන දිනයන් වලින් පළමු දිනයේ දි සියලුම නිලධාරීන් සඳහා ආහාරපාන සුදානම් කිරීමට කොබ්බැකඩුව ගොවි කටයුතු

පර්යේෂණ ආයතනයේ ආපන ශාලාවට දන්වා තිබුණි. අනපේක්ෂිතව නිලධාරීන් කිහිප දෙනෙක් පැමිණීම නිසා අමතර වියදමක් දැරීමට සිදු විය.

(ඊ) අක්ෂි කාච මිලදීගැනීම හා බෙදා හැරීම

සමාලෝචිත වර්ෂයේදී අක්ෂි කාච 1800 ක් හා ශ්‍රවන උපකරණ 60 ක් ලබා දීමට සැලසුම් කර තිබුණ ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවීම නිසා ඉලක්ක කරා ලඟා වීමට නොහැකි විය.

(උ) ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය - 2012

i. අදාල කාලය වැඩ බලන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙම ආයතනය පාලනය කළ අතර, අතපසුවීමකින් අදාල ඇස්තමේන්තුව අනුමත කරගැනීමට නොහැකි වී ඇත. මින් ඉදිරියට එවැනි දෝශ ඇති නොවීමට වගබලා ගනු ඇත.

ii. වැඩිහිටි දින උත්සවය වෙනුවෙන් සහ එවැනි උත්සව පැවැත්වීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 50 ක් වෙත රු. 10,000/- ක් බැගින් ලබාදුන් මුදල ද ඇතුලත්ව සමස්ත වියදම රු. 1,013,000/- කි. එයින් රු. 791,448/- මෙම ආයතනය විසින් දරන ලද අතර, ඉතිරි මුදල වූ රු. 221,552/- ක මුදල සෘජුව හෙල්ප්ඒජ් ආයතනය විසින් දරන ලද බැවින් ලෙජර්ගත නොවේ.

iii. වැඩිහිටි දින උත්සවය සඳහා ඇස්තමේන්තුව සකස් කිරීමට වැය වේතැයි අපේක්ෂා කළ මුදල වැය නොවූ අතර, මින් ඉදිරියට ඇස්තමේන්තු සකස් කිරීමේදී සැලකිලිමත් වන ලෙස උපදෙස් ලබාදී ඇත.

iv. 2012 ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය වෙනුවෙන් එවැනි උත්සව සංවිධානය කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 100 ක් වෙනුවෙන් රු. 10,000/- ක් බැගින් මුදල් ලබාදීමට අපේක්ෂා කළ ද මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම තුළ එකී කාර්ය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 50 කට සීමා කිරීමට සිදුවිය.

v. අදාල කරුණ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් විමසීමක් කර ඇති අතර, ඉදිරියේදී නිවැරදි කරනු ඇත.

(ඌ) <u>කතරගම වැඩිහිටි නිවාසයේ නඩත්තු වියදම්</u>

මෙම නඩත්තු වියදම ලෙස ජල,විදුලි,පවිත්‍රතා හා සේවක වැටුප් ආදිය සඳහා දරණ වියදම් අදහස් වේ. පවිත්‍රතා කටයුතු හා සේවක වැටුප් සඳහා ගෙවන වියදම් වල වෙනසක් (මාසිකව) සිදු නොවුනත් ජලය හා විදුලි සඳහා ගෙවීමට සිදු වන වියදමේ හි වෙනස්කම් සිදු වනු ඇත.
එබැවින් මේ සඳහා වෙන් කර තිබූ මුදලට වඩා අඩු වියදම් දැරීමට සිදු විය.වෙන් කර ඇත්තේ අපේක්ෂිත වියදමකි.

(එ) <u>උපදේශන රැස්වීම් පැවැත්වීම</u>

2012 වසරේ ක්‍රියාකාරී සැලසුමට අනුව උපදේශන රැස්වීම් පැවැත්වීම සඳහා රු. 800,000 ක් ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව සත්‍ය වියදම රු 409,503 ක් වන අතර විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි රු.7,330,000 වියදම් වී නොමැත. අවසන් ගිණුමේද මෙය නිවැරදිව සඳහන් කර ඇත.

(ඒ) <u>නඩත්තු මණ්ඩල රැස්වීම්</u>

2012 වසරේ වැඩිහිටි නඩත්තු වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 0.875 කි. තවද වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවන නිසා රු. 239,300/- මුදලක් මාරු කර ගන්නා ලදි.2010 වසරේ උපචිත වියදම් වශයෙන් මෙම වසරේ රු. 68,000 ක් ගෙවීම් කරන ලදි. එම වසරේ දෙසැම්බර් 31 දිනට දරණ වියදම රු. 1,103,014 ප්‍රගතිය ඇතුලත් වාර්තාවක් මේ සමඟ අමුණා එවමි.

(ඔ) <u>වැඩිහිටි නිවාස අළුත්වැඩියා කටයුතු සඳහා අධාර ලබා දීම</u>

i. ඇඹිලිපිටියේ වළල්ගොඩ සරණ සෙවණ වැඩිහිටි නිවාසයේ ගිලන් කාමරය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම ලිපි ගොණුවට ඇමුණුම් කිරීමට කටයුතු කරනු ඇත.

ii. වැරදීමකින් සටහන් වී ඇත. මෙවැනි අඩුපාඩු ඉදිරියේ දී සිදු නොවීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

iii. වැරදීමකින් සටහන් වී ඇත. මෙවැනි අඩුපාඩු ඉදිරියේ දී සිදු නොවීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

(ඕ) <u>වැඩිහිටි දීමනාව ගෙවීම</u>

i. 2012 ජූනි මස ගිණුම් ආරම්භ කිරීම සඳහා මුදලින් රු. 182,379,000 ක් ලබා දුන් අතර ජා.ඉ.කි.බැංකුව ආරම්භ කරන ලද ගිණුම් ප්‍රමාණය 181417 ක් විය. ඒ අනුව, එහි ඉතිරි මුදල් වන රු. 926,000 සඳහා අංක 343314 දරණ චෙක්පත ලබාදී ඇත.

ii. ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 කින් තොරතුරු රැස්කළ යුතුව තිබූ අතර, මෙම වැඩසටහන ඉතා කඩිනමින් කළ යුතුව තිබූ බැවිනුත්, තොරතුරු ලැබෙන ආකාරය අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත අදාල අයදුම්පත් එවන ලදී. එහිදී, විටින් විට බැංකුව වෙත අයදුම්පත් එවීම ප්‍රායෝගික නොවුනු අතර, අවසානයට ලැබුණු අයදුම්පත් කාලය ඉක්මවා ගොස් තිබුණු බැවින් බැංකුව වෙත නොයවා රඳවාගන්නා ලදී.

iii. මෙම වැඩසටහන් ජාතික මට්ටමේ වැඩසටහන් වූ අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනෙකුත් දෛනික රාජකාරී සමඟ මෙම කටයුත්ත කෙටිම කාලයකින් කිරීම අපහසු විය. එහිදී ඔවුන්ට මාස කිහිපයක් මේ වෙනුවෙන් වෙහෙසීමට සිදුවිය. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 කින් අයදුම්පත් විටින් විට ප්‍රධාන කාර්යාලයට ලැබුනු අතර, ඒ අනුව බැංකුව වෙත යොමු කරන ලදී. එහිදී ගෙවීම් කටයුතු ද අවස්ථා කිහිපයකදී කිරීමට සිදුවූ අතර, 2012 ජූනි මස දීමනාව ඔක්තෝබර් මස දක්වා ගෙවීම් කටයුතු කිරීමට ද සිදුවිය.

iv. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී 2012 ජූලි මස සඳහා පමණක් අදාල බැංකු පොත් හරහා ගෙවීම් කිරීමට ප්‍රතිපාදන ලැබී තිබුණි.

(ක) i, ii, iii, iv

ඔබ විසින් දක්වා තිබුණු කරුණු සම්බන්ධව අපගේ අවධානය යොමු වී ඇති අතර මේ වන විට අදාල අංශ සමග සාකච්ඡා කරමින් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභී යෝජනා ක්‍රමයක් හා ඔබ විසින් දක්වා ඇති ඉතිරි යෝජනා සඳහා වැඩසටහන් සකස් කරමින් පවතී. මෙම සමස්ථ ක්‍රියාවලිය ඉතා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් වන බැවින් එක් වර්ෂයක් වැනි කෙටි කාලයකි දි සර්ව සම්පූර්ණ කළ නොහැකි බැවින් ඉහත වර්ෂ කිහිපය තුළ දි උක්ත අරමුණු කරා ළඟා වීමට බලාපොරොත්තු වේ.

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ඔබ විසින් (අ) හා (ආ) දක්වා ඇති නිරීක්ෂණ මඟින් පෙන්නුම් කර ඇති අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව, මවුපිය වැඩිහිටි නිවාසය මීපාගම ඉදිකිරීම් සම්බන්ධව කටයුතු කරන ලද පළාත් සමාජ සේවා අධ්‍යක්ෂක වෙතින් විමසා ඇති අතර, ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ඔහු විසින් ගැනීමට නියමිතව ඇත. තවද එමඟින් ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධව මනුව දැනුවත් කිරීමට කටයුතු කරන බවද මෙයින් දන්වා සිටිමි.

4.3 **පරිත්‍යාග කළ දේපල**

(අ), (ආ), (ඇ), (ඈ), (ඉ) මඟින් දක්වා ඇති අදාල ඉඩම කිසිදු අවස්ථාවක නෛතික වශයෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට පවරාදී නොතිබිණි. නමුත්, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක අතර, ඇතිකරගත් එකඟතාවයක් පමණක් තිබුණි. පවතින තත්ත්වය මත අදාල ඉඩම සහ ගොඩනැගිල්ල භාවිතා කරමින් වැඩිහිටි නිවාසයක් ආරම්භ කිරීමට නොහැකි බැවින් අදාල ඉඩම සහ ගොඩනැගිල්ල ඇතුලත් ලිපි ගොනුව 2013.07.13 දින සමාජ සේවා දෙපාර්තමේන්තුවට බාරදීමට කටයුතු කර ඇත. ඒ අනුව, තවදුරටත් අදාල දේපළ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වගකීමට බැඳී නොසිටිනවා ඇත.

5.3 **අයවැය පාලනය**

අයවැය ලේඛනය හා සත්‍ය ආදායම් වියදම් අතර, 12% - 374% ක් දක්වා වූ විශාල විචලනයට හේතුවී ඇත්තේ වැඩිහිටියන් සඳහා මාසිකව ගෙවූ රු. 1,000/- දීමනාව ගෙවීම් කිරීමයි. මෙය ඇස්තමේන්තු නොකළ වියදමකි. මේ සඳහා මුදලක් ද අමාත්‍යාංශය විසින් වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. මහින්ද චින්තන වැඩපිළිවෙල අනුව මෙය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සිදුවූ බැවින් පූර්ව සූදානමක් නොමැතිව ක්ෂණිකව ක්‍රියාත්මක කළ වැඩසටහනක් විය.

6. **පද්ධති පාලනය**

(අ) ලෙජරය පවත්වාගෙන යාම

ක්‍රමානුකූලව ලෙජරය පවත්වාගෙන යාමට විෂය නිලධාරියා දැනුවත් කර ඇත.

(ආ) මුද්දර තොග ලේඛනය

දෛනිකව මුද්දර ලේඛනය තුලනය කර ශේෂයන් ඉදිරියට ගෙන යමින් මුද්දර අග්‍රිමය ක්‍රමානුකූලව ප්‍රතිපූර්ණය කරගෙන යාමට කටයුතු කර ඇත.

(ඇ) උත්සව අත්තිකාරම් ලේඛනය

ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට උපදෙස් දී ඇති අතර, 2013 වසරේ මෙය ක්‍රමානුකූලව කරගෙන යනු ලැබේ.

(ඈ) අක්ෂි කාච නිකුත් කිරීම

මේ සඳහා අදාල නිලධාරීන් දැනුවත් කර ක්‍රමානුකූලව කරගෙන යනු ලැබේ.

සභාපති,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව,
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය.